*2017 ජූනි මස 27 අඟහරුවාදා දින*
*2017 ஜூன் மாதம் 27 ஆம் திகதி செவ்வாய்க்கிழமை* ***Tuesday 27th June 2017***

ගරු නියෝජ්‍ය සභාපති උදයකාන්ත ගුණතිලක මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ பிரதித் தவிசாளர் உதயகாந்த குணதிலக அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.D.Chairman Udayakantha Gunathilaka preside the Chair

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---

සියළුදෙනාටම සුභ උදෑසනක්, සුභ දවසක් ප්‍රාර්ථනා කරනවා පළමුව. ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ඒ වගේම අමාත්‍යතුමන්ලා, සභානායකතුමා, ඒ වගේම ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා, විපක්ෂනායකතුමා, විපක්ෂ සංවිධායකතුමා ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. 2017 ජූනි මස 27 වෙනි අඟහරුවාදා වන අද දින සභාව ආරම්භ කිරීම සඳහා ඒ වගේම කරගෙන යාම සඳහා සියළුදෙනාගේම සහාය අපේක්ෂා කරනවා. පළමුව න්‍යාය පත්‍රය අනුව,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම්: නැත**

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ : නැත**

**ගරු සභාපතිතුමාගේ නිවේදන : නැත**

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

ගරු අමාත්‍ය ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමා.
ගරු මන්ත්‍රී නිමල් විජේනායක මැතිතුමා.
ගරු මන්ත්‍රී ජයතිස්ස රණවීර මැතිතුමා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම : නැත**

**කාරක සභා වාර්තා පිළිගැන්වීම : නැත**

**පෙත්සම් : නැත**

**ප්‍රශ්න : නැත**

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ : නැත**

**පෞද්ගලික ප්‍රකාශ කිරීම :**

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---

මේ යටතේ ගරු අරුණ නිලන්ත ජයසිංහ මැතිතුමාට අවස්ථාව ලබාදෙනවා.

***ගරු මන්ත්‍රී නිලන්ත ජයසිංහ***
***கௌரவ நிலந்த ஜயசிங்க***
*Hon Member Nilantha Jayasighe*

---------------------------------------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, ඇත්තටම ඩෙංගු පිළිබඳව තමයි මම මේ අවස්ථාවේ කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. ශාන්ත ඇලෝසියස් විද්‍යාලයේ මම ආදි ශිෂ්‍යයෙක් විදිහට ඇලෝසියස් විද්‍යාලයට ගිය වෙලාවේ අපි ඩෙංගු මර්ධන වැඩ සටහන අතරතුර මම හිතන්නේ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාත් ඒ වෙලාවේ සහභාගී වෙලා හිටියා, අපේ පළාත් සභාවේ හිටපු මන්ත්‍රීතුමා. අපි දැක්කා අලෝසියස් විද්‍යාලයේ භූමිය ශුද්ධ කරගෙන යන අවස්ථාවේ දී එහි මුළු භූමි ප්‍රමාණයෙන් කොටසක් කඩ හිමියෙකු විසින් ධන ලක්ෂ්මි හාඩ්වෙයාර් කියන කඩ හිමියා විසින් අල්ලාගෙන ඉන්නවා. අපි ඒක ශුද්ධ කරන්න ගිය වෙලාවේ පොලීසියත් මැදිහත් වෙලා හිටියා. ඒ වගේම එම්.ඕ.එච්.එකේ සියළුදෙනාත් හිටියා. ඒ ශුද්ධ කරන අවස්ථාවේ එතුමා ප්‍රකාශ කළා මේ කොටස ඔහුට අයිති කොටසක් කියලා. නමුත් අපි දන්න විදිහට මා ලඟ තියනවා ගැසට් පත්‍රය 1961 ගැසට් පත්‍රය අනුව දෙසැම්බර් 01 වෙනිදා ගැසට් කරලා තියෙන්නේ. මේ ගැසට් පත්‍රය අනුව මෙම භූමිය අක්කර දෙකක භූමි ප්‍රමාණයක්. මම හිතන්නෙ මම පමණක් නෙමෙයි ඉෆ්ලාර් මන්ත්‍රීතුමාත් ආදි ශිෂ්‍යයෙක් විදිහට කටයුතු කරන පාසැලක්. මේ පාසැලේ භූමිය අක්කර දෙකකට වැඩි ප්‍රමාණයක් තියනවා. මේකේ ඒ පැත්තේ මායිම වෙන්නේ රේල් පාර. එදා තිබුණ රේල් පාර තමයි මායිම විදිහට තියෙන්නේ. මේ ගැසට් පත්‍රයේ තියන ආකාරය. නමුත් මේ වනවිට අර ධන ලක්ෂ්මි හාඩ්වෙයාර් කියන මුදලාලි විසින් මේක අල්ලාගෙන ඉන්නවා. මේකේ වෙනත් බඩු වගයක් දාලා තියනවා. ඒ බඩු ටික ඉවත් කරන්න කියලා ගිහාම පස්සේ පොඩි මත ගැටුමක් ඇති වුනා එතන ප්‍රාදේශීය ලේකම්තුමියත් හිටියා. ඒ සියළුදෙනා ඉන්දැද්දී තමයි මත ගැටුම ඇති වුනේ. හැබැයි මේක මම හිතන්නේ ඒ කොටස පාසැලට අයිති කොටසක්. ඔහු විසින් මට මතකයි 1992 අවුරුද්දේ මම සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටියේ. ඒ අවස්ථාවෙත් එතුමා එතන ගේට්ටුව වහලා බැම්මක් ඉදිකරලා තිබුණා. මට මතකයි ඒ දවස්වල ශිෂ්‍යයෝ එළියට ගිහිල්ලා උද්ඝෝෂණයකට පවා යන්න ගිහිල්ලා ඒ බැම්ම ඉවත් කළේ. හැබැයි ඉතින් ඒ නිසා මේක විශාල ගැටළුවක්. ඇලෝසියස් විද්‍යාලය කියන්නේ අපේ රටට විශාල වශයෙන් මම හිතන්නේ අපි දේශපාලඥයෝ විදිහට බැලුවාම රත්නපුර දිස්ත්‍රික්කයේ වැඩිම දේශපාලඥයෝ බිහිවෙලා ඉන්නේ ඇලෝසියස් විද්‍යාලය හරහා. ඒ වගේම නීතිඥවරු, විවිධ වෘත්තිකයන් බිහිවෙලා තියනවා. මේ පාසැලේ විවිධ ශිෂ්‍යයන් විවිධ ස්ථානවල ඉන්නවා. හැබැයි ඒ සියළුදෙනාම ආදි ශිෂ්‍යයන් විදිහට අපි සාකච්ඡා පැවැත්වුවා. ඒ සාකච්ඡාවේ දී තීරණය වුනේ මේ පාසැලට වෙන හානිය වළක්වන්න. මේ පාසැලේ භූමිය එක පැත්තකින් පල්ලිය පැත්තෙන් ටික ටික අඩු වේගෙන එනවා. හැබැයි අපට පල්ලියෙන් අපි පාසැල ලබාගෙන තියනවා, ගැසට් එක අනුව. ඒ භූමිය අනෙක් පැත්තෙනුත් දැන් එන්න එන්න අපට නැති වීගෙන යනවා. ඉතින් මේ පාසැල දියුණු පාසැලක් විදිහට මම හිතන්නේ ජාතික පාසැල් අතුරින් සීවලි මධ්‍ය මහා විද්‍යාලය, අලෝසියස් විද්‍යාලය, ෆර්ගියුෂන් විද්‍යාලය, එතකොට කොන්වන්ට් එක. ඔය පාසැල් හතර තමයි අපේ නගරය මධ්‍යයේ තියන පාසැල්. මේ පාසැල්වල තදබදය අපි හැම අවස්ථාවකම කථා කරනවා 1 වසරට දරුවන් ඇතුළත් කිරීම ගැන. ඒ විදිහට කථා කරන වෙලාවේ මේ පාසැලේ තියන භූමිය මේ ආකාරයෙන් අල්ලා ගත්තොත් විශාල ප්‍රශ්නයක් වෙනවා. මොකද ඉස්සරහට මේ පාසැලේ දරුවන්, ඒ වගේම ආදි ශිෂ්‍යයන් සියළුදෙනා මේ පාසැල ගැන විශාල වශයෙන් විමසිල්ලෙන් ඉන්නවා. මේක යම්කිසි අරගලයකට යන්න පුළුවන්. මොකද අරගලයක් කියන්නේ අද වෙනකොට අපි දැක්කා යම් යම් අවස්ථාවල දී යම් යම් ගැටළුකාරී තත්ත්වයන් රට තුළ ඉස්මතු වෙනවා. ජාතිවාදී අරගලවලට හරවනවා. පහුගිය දවස්වල එහෙම දෙයක් වුනා අපේ

ප්‍රදේශයේ, ගමේ තුන් හතර දෙනෙක් එක්ක ඇති වෙච්ච ගැටුමක දී ඒ ගැටුම ජාතිවාදී අරගලයක් බවට පත් කරන්න සමහරු උත්සාහ කළා. මම හිතන්නේ ඒක තමයි අද ඒ වගේ තත්ත්වයක් උදා කරන්න උත්සාහ කරන්න පුළුවන්. මේක ජාතිවාදී ගැටුමක් නෙමෙයි. නමුත් මේක පාසැල් භූමියක්, රජයේ භූමියක්. මේකට ප්‍රාදේශීය ලේකම්ට මැදිහත් වෙන්න පුළුවන්, රජයේ බිමක් විදිහට. මේක නඩු පවරලා හරි, මොන යම් ආකාරයෙන් හෝ මේ භූමිය නිදහස් කරලා පාසැලට අවශ්‍ය පහසුකම් සළසා දීමේ කටයුත්ත කළයුතු වෙනවා. මොකද ජාතික පාසැලක් වුනත් මම හිතන්නේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම තියනවා. මේක යෝජනාවක් විදිහට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී සාකච්ඡා වෙන්න පුළුවන්. ඒ නිසා ඒ සාකච්ඡාවටත් මේකත් එකතු කරන්න කියන ඉල්ලීම මම කරනවා. මොකද මේ ගැසට් පත්‍රය මම සභාගත කරනවා මේ අවස්ථාවේ දී. මොකද මේ රජයෙන් නිකුත් කරන ගැසට් පත්‍රයක් තියෙද්දිත් මේ පාසැල් භූමිය වෙනත් අයෙකුට අල්ලා ගන්න පුළුවන් නම් ඒක මම හිතන්නේ කණගාටුදායක කාරණාවක්. ඒ නිසා මේ පාසැල් භූමිය ආරක්ෂා කරදීමේ වගකීම පළාත් සභාව සතුයි. මම හිතන්නේ අපි සතු පළාත් සභාව සතු වගකීමක් වගේම මධ්‍යම රජයෙත් වගකීමක්. ජාතික පාසැලක් විදිහට මේ පාසැලේ භූමිය ආරක්ෂා කරදීමේ වගකීමට අවශ්‍ය කටයුතු සළසා දෙන්න කියන ඉල්ලීම මේ අවස්ථාවේ දී කරනවා.

ඒ වගේම එළඹෙන 30 වෙනිදා පවතින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යෝජනාවක් විදිහට මෙය ඉදිරිපත් කරන්න කියන ඉල්ලීමත් මම මේ අවස්ථාවේ කරමින් මෙම ගැසට් පත්‍රයේ පිටපත මම සභාගත කරනවා මේ අවස්ථාවේ දී. බොහොම ස්තූතියි !

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

ස්තුතියි ! නිලන්ත ගරු මන්ත්‍රීතුමාට. ඒ යෝජනාව සම්බන්ධව අදාළ අමාත්‍යවරයා, ඒ වගේම අමාත්‍යාංශයේ ලේකම්තුමා, ඒ වගේම ඒ අදාළ දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු ඒ අදාළ අංශවලට යොමු කරලා, මේ සම්බන්ධව වාර්තාවක් ලබාගෙන අවශ්‍ය කටයුතු කරන්න මේ සභාවට යෝජනා කරනවා.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්* *கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.Member M.Y.M.Iflar* ----------
------------------------------

ගරු සභාපතිතුමනි, වාර්තාවක් නෙමෙයි මේ සම්බන්ධයෙන් එතුමා කියපු විදිහට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවටත්, ඒ වගේම මේක ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ මේ සම්බන්ධයෙන් සාකච්ඡා වුනා, රත්නපුරේ. ඒ වගේම මේ පාසැල මටත් සම්බන්ධ වෙච්ච, මමත් අධ්‍යාපනය ලබපු, ඉහළ අධ්‍යාපනය ලබන්න අවස්ථාව ලබාදීපු පාසැලක්. නමුත් මේ ගැටළුව ගත්තාම ධන ලක්ෂ්මී ආයතනය පමණක් නෙමෙයි දිගටම තියන තීරුව පිළිබඳ ගැටළුවක් තියෙන්නේ. එක පුද්ගලයෙක් නෙමෙයි. නමුත් මේ පිළිබඳව නිශ්චිත මැනුමක් අරගෙන මේ කටයුත්ත කළා නම් මම හිතන්නේ කාටවත් හානියක් වෙන්නේ නෑ. අහිතකර දෙයක් සිද්ධ වෙන්නේ නෑ. රජයේ මැනුම අරගෙන, මේක මැනලා විසඳා ගත්තා නම් මීට වඩා හොඳයි. මොකද එක පුද්ගලයෙක් එතුමා කියපු විදිහට එක පුද්ගලයෙක් විතරයි ඔබතුමා නම් කරන්නේ. ඒ නම් කරනකොට මෙතන අපට ජාතිවාදී ස්වරූපයක් පෙනී යනවා. එහෙම දෙයක් නොවෙන්න ඕන. මොකද මේ

තීරුව දිගටම තියනවා. එක කඩයක් නෙමෙයි දිගටම තියනවා කඩ. ඒ නිසා ඒක නිවැරදි කරමු අපි. නිසි මැනුමක් අනුව යම් දෙයක් සිදුවෙලා තියනවා නම් ඒ හානිය නිවැරදි කරගන්න කටයුතු කරන්න කියලා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

ඒ අදාළ අංශවලට වාර්තා කිරීමත්, ඒ වාර්තා කරලා ඒ සම්බන්ධව සභාවට වාර්තාවක් කැඳවා ගැනීමටත් අවශ්‍ය පියවර ගැනීමට තමයි සභාව තීන්දු කරන්නේ. යෝජනා කරන්නේ. මීළඟට කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක*** ***கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக*** *Hon.Member K.L.Ratnayake*
------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේක ඇත්තටම අපේ ගරු ප්‍රධාන ඇමතිතුමාගේ විෂයය පථයට අයිති කාරණාවක්. මොකද මට පහුගිය දවස්වල දී කිරිඇල්ල සමූපකාර සමිතිය යටතේ තියන ඇරැපොල ග්‍රාමීය බැංකුව හරහා 1998 මම ලක්ෂ එක හමාරක ලෝන් එකක් ගන්නවා. මේක 2004 දී ගරු ප්‍රධාන ඇමතිතුමනි, මම 480,000/- ක් දීලා නිම කරනවා. හැබැයි මගේ ඉඩමේ ප්ලෑන් එක මට ලැබුනෙ නෑ. 40,000/- ක් දීලා තමයි මම ඇදගත්තේ ඒක. ග්‍රාමීය බැංකුවෙන් ඇහුවාම අස්ථානගත වෙලා. ඊට පස්සේ සමූපකාර සමිතියෙන් ඇහුවාම ඒත් අස්ථානගත වෙලා. මේ පිළිබඳව ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද මේක අද මට වෙන්න පුළුවන්. තව සාමාන්‍ය දුප්පත් මනුස්සයෙකුට මේ වගේ අසාධාරණයක් වුනොත් ඒ අය ලොකු අපහසුතාවයකට පත්වෙන නිසා ගරු ප්‍රධාන ඇමතිතුමනි.

ඒ වගේම ඒ බැංකුවෙන්ම බයිසිකලයක් අරගෙන තියනවා අපේ අසල්වාසී තරුණයෙක්. අන්තිමට එයාගේ පොත නැති කරලා. එතකොට පොත නැතුවාම ලයිසන්ස් ඉන්ෂුවරන්ස් කරගන්න බෑ. දවස් කීපයක් පොලීසියෙන් ඇල්លුවා. යන්තම් කථා කරලා බේරාගෙන දැනට තියනවා. කථා කළාම ඔබතුමා ගාවට ආවාමත් ඒක ඔබතුමා යොමු කළා සමූපකාර ලේකම්තුමා ගාවට. දැන් බැංකුවෙන් කියන්නේ බයිසිකලය අරගෙන ආපහු සල්ලි දෙන්නම් කියන කාරණාව. මෙතනදී දැන් එක කාරණාවක් විතරයි ප්‍රධාන ඇමතිතුමනි. මේක දිගින් දිගටම වෙන්න ගියොත් මගේ හිතේ කිරිඇල්ල සමූපකාර සමිතිය කොතනක නතර වෙයිද කියන එක අපට කියන්න බෑ. දැන් ඊයේ පෙරෙයිදා සංඝයා වහන්සේ නමක් සභාපති ධූරයට පත්වෙලා තියනවා. මොකද පහුගිය වකවානුවල ඒ වගේ අපහසුතාවයන්වලට පත්වෙලා තියනවා, ග්‍රාමීය බැංකුවත්, සමූපකාර සමිතියත්. ඒ නිසා විෂයය භාර ඇමතිතුමා හැටියට ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා මේ වගේ අකටයුතුකම් මින් ඉදිරියට වෙන්න දෙන්න එපා කියන කාරණාව මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

බොහොම ස්තුතියි ! ගරු රත්නායක මන්ත්‍රීතුමාට. මීළඟට රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ* *கௌரவ*
*உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.Member*
*Ramya Kumara Weerasinghe* ----------
--------------------------------------------

ගරු සභාපතිතුමනි, ඉතාම සංවේදී කරුණක් මට පෞද්ගලිකව බලපාපු. පහුගිය දිනවල එක දවසේ මළ ගෙවල් තුනකට යන්න වුනා. ඒ මළ ගෙවල් තුනම ගරු සභාපතිතුමනි, ප්‍රින්සෝ කියන රෙදි හෝදන ද්‍රව්‍ය පාවිච්චි කරලා මිය ගිය තරුණයෝ තුන්දෙනෙක්. ඒ වගේ තුනක් විතරක් නෙමෙයි අති විශාල සංඛ්‍යාවක් මේ දිනවල මේ ප්‍රින්සෝ කියන රෙදි හෝදන කුඩ බීලා මිය ගිහින් තියනවා. මේක ඉතා බරපතල කාරණාවක් හැටියට මම දකින්නේ. මේක මම කියනකොට කවුරු හරි කියයි මැරෙන්න හිතුන එකා කොහොමටත් මැරෙනවා. කොහොම හරි මැරෙයි කියලා. හැබැයි සමහර වෙලාවට මැරෙන්න හිතුනට ඒක ඉතා ක්ෂණිකව ඇති වෙන බොහොම සංවේදී සිතුවිල්ලක්. ඒ වෙලාවේ දී මැරෙන්න කියලා හිතුනාට ක්ෂණිකව මැරෙන්න වුනේ නැත්නම් ඔහු ජීවත් වෙනවා. ඒ හින්දා ගැටේ දාගන්න බැරි එකා බෙල්ලෙ වැල දාගන්නේ නෑ. එහෙම නැත්නම් ඇසිඩ් ටික බොන කොට අමාරු නිසා ඇසිටික් ඇසිඩ් ටික බීලා මැරෙන එක්කෙනා මේකේ තියන අමාරුකම දැකලා එහෙම මැරෙන්නෙ නෑ. හැබැයි ප්‍රින්සෝ එක ගත්තාම ප්‍රින්සෝ එක බොහොම පහසුවෙන් බොන්න පුළුවන්. අරක බීලා විනාඩි දෙකක් තුනක් යනකොට ජීවිතක්ෂයට පත් වෙනවා. ඒ නිසා අද සියදිවි නසා ගැනීමේ ප්‍රතිශතය අපේ ප්‍රදේශයේ විශේෂයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ මම දන්නේ නෑ අනෙක් තැන්වල. රත්නපුර දිස්ත්‍රික්කයේ බරපතල විදිහට වැඩි වෙලා තියනවා විතරක් නෙමෙයි දවසකට මළ ගෙවල් දෙකක් තුනක් තියනවා ප්‍රින්සෝ බීලා මැරුන අයගේ. ඒ නිසා මේ සංවේදී කාරණාව පිළිබඳව බලලා මේ ප්‍රින්සෝ කියන රෙදි සෝදන කුඩ වෙළඳ පොළේ තහනම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අදාළ අංශවලට සහ මධ්‍යම රජයට යෝජනා කිරීම මේ වෙලාවේ අපි විසින් අනිවාර්යයෙන්ම කළයුතු කාරණාවක් විදිහට මම දකිනවා. නැත්නම් ඉතා වටිනා තරුණ ජීවිත විශාල සංඛ්‍යාවක් ඉදිරියේ දී තවත් මේ විදිහට විනාශ වෙන්න පුළුවන්. මේක ඉතාම ක්ෂණිකව කිසිම අපහසුවකින් තොරව ජීවිතය අවසන් කිරීමේ තීරණයක් හැටියට අද පාවිච්චි වෙමින් තියනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම මීට වඩා දීර්ඝව ඒ ගැන කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ. මම ඉල්ලීමක් කරනවා මේ ගරු සභාවෙන් මේ කාරණාව පිළිබඳව දැඩි අවධානයක් යොමු කරලා අදාළ අංශවලට, බලධාරීන්ට, මධ්‍යම රජයට මේ පිළිබඳව දන්වලා ප්‍රින්සෝ භාවිතය පාවිච්චිය වැළැක්වීමට, වෙළඳ පොළේ අළෙවි කිරීම තහනම් කිරීමට පියවර ගැනීම කාලෝචිත කරුණක් බව මේ ගරු සභාවට ඉතාම ගෞරවයෙන් ප්‍රකාශ කරනවා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

බොහොම ස්තූතියි ! ඒ පිළිබඳව සභාවේ අවධානය යොමු කරනවා. අදාළ අංශ දැනුවත් කිරීමත්, ඒ වගේම ඒ අදාළ වාර්තා ලබා ගැනීමටත් කටයුතු කරනවා. ඊළඟට ඊළඟට ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* *கௌரவ*
*உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member*
*G.M.Karunapala* --------------
---------------------------

ගරු සභාපතිතුමනි, ඇතැම් අපේ හිතවත් මන්ත්‍රීවරු මේක පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි කියලා කියන්නට පුළුවන්. නමුත් මේක පෞද්ගලික ප්‍රශ්නයක්. මොකද අද 27 යි. පහුගිය මාසේ 26 වෙනිදා තමයි මේ

ව්‍යසනය ඇති වුනේ. දැන් මාසයක් ගත වෙලා. ඒ ව්‍යසනයට ලක්වුන නාය යෑම් නිසා තමාගේ ගෙවල් දොරවල් අත හැරලා ගිහිල්ලා කඳවුරුගතව සිටින, හිතවතුන්ගේ නිවෙස්වල සිටින, තම ප්‍රදේශය අතහැර ගොස් සිටින අයගේ මානසික වශයෙන්....

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல* *Hon.Opposition Whip Siripala Kiriella* -----------------------------------------------------

මේ පෞද්ගලික ප්‍රශ්නයක් ද නියෝජ්‍ය සභාපතිතුමා ?

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
--------------------------------------------------------------

මම දන්නේ නෑ මොකක්ද ඉදිරිපත් කරන්නේ කියලා. පෞද්ගලික ප්‍රකාශ යටතේ ලිපියක් ඉදිරිපත් කරලා න්‍යාය පත්‍රයට ඇතුල් කරලා තියනවා. එතකොට මම දන්නේ නෑ, එතුමා යෝජනාව ඉදිරිපත් කළාට පස්සේ තමයි මම දන්නේ.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල*** *கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member G.M.Karunapala* ----------------------------------------

මගේ කථාව ඉවර වුනාට පස්සේ අහන්න පෞද්ගලික ද ? පොදු ද ? නැත්නම් විකාරයක් ද ? කියලා. මේක අවබෝධයක් ලබන්න ඕන. අවබෝධයක් නැතුව කථා කරන්න බෑ. යමකට ඇහුම්කන් දෙන්න ඕන. ඒකයි මම සභාපතිතුමාට ලිඛිතව දැනුම් දුන්නේ, පෞද්ගලික ප්‍රශ්නයක් ලෙස මම මේක ඉදිරිපත් කරනවා කියලා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
--------------------------------------------------------------

කවුරු වුනත් පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කරනකොට පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ඉල්ලනවා. අහවල් යෝජනාව කියලා ලියලා ඉදිරිපත් කරන්නේ නෑ. පෞද්ගලික ප්‍රකාශ කරන්න මමත් මගේ මන්ත්‍රී සීට් එකේ ඉන්නකොට ඉල්ලන්නේ ඉදිරිපත් කිරීමට අවස්ථාවක්. මන්ත්‍රීවරයා දැන ගන්න ඕන ඒ යෝජනාව ඉදිරිපත් කරනකොට කොයි තරම් තමන්ට පෞද්ගලිකව දැනෙන යෝජනාවක් වියයුතුයි කියලා. ඒක ඉදිරිපත් කිරීමේ දී තමයි මම දන්නේ පෞද්ගලික යෝජනාවක් ද ? පොදු යෝජනාවක් ද ? කියන ප්‍රශ්නය. ඒක හින්දා මන්ත්‍රීවරු තමන්ගේ වගකීම ඒ ආකාරයෙන් ඉෂ්ඨ කිරීම තමයි මේ සභාව ඉදිරියට ගෙන යෑම සඳහා අවශ්‍ය වෙන්නේ. ඒ නිසා ඒ පෞද්ගලික කාරණාව ඉදිරිපත් කරලා, තමන්ගේ යෝජනාව ඉදිරිපත් කරන්න කියලා තමයි මට ඉල්ලන්න වෙන්නේ. මට ඒක තීන්දු කරන්න වෙන්නේ එතුමාගේ යෝජනාව මොකක්ද කියලා මම දන්නේ නැතුව කොහොමද මම කියන්නේ නවත්වන්න කියලා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல* *Hon.Opposition Whip Siripala Kiriella* -----------------------------------------------------

ඒක තමයි සභාපතිතුමා කියන්නේ.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------------

සභාපතිතුමා කියපු පළියට, මෙතන මූලාසනයේ වාඩි වුන පළියට මට එහෙම නවත්වන්න බෑ, මම ප්‍රශ්නය දන්නේ නැතුව.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල*** ***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால*** *Hon.Member G.M.Karunapala*
---------------------------------------

මගේ පවුලට සම්බන්ධ තිදෙනෙක් මේ ව්‍යසනයෙන් ජීවිතක්ෂයට පත් වුනා. මට පෞද්ගලික නොවේද ? පෞද්ගලිකයි. එක එක අයෙකුට එක එක හැඟීම්බර කථා තියනවා. අපටත් තියනවා. මම සන්තෝෂ වෙන්නේ කරුණාපාල නැගිට්ටොත් විතරයි රීති ද, අරක ද, මේක ද ඔක්කෝම පෞද්ගලික ප්‍රශ්න. ඒකත් හොඳයි එක පැත්තකින්. මම කථා කරන්නේ ඇත්ත. මාසයකුත් දවසක් ගියා නාය ගිහිල්ලා, ගංවතුර ගිහිල්ලා. රුපියල් 10,000/- දීමනාව දුන්නා. ලක්ෂයේ දීමනාව දුන්නා, මරන සංඛ්‍යාව සඳහා. මම ඇහුවා මගේ හිතවත් විපක්ෂයේ මන්ත්‍රීතුමෙක්ගෙන්, මම නම එහෙම කියන්නේ නෑ. අරක හම්බ වෙනවාද ලක්ෂ 10 කියලා. දන්නේ නෑ කිව්වා. දන්නෙ නෑ. මරණයක් සඳහා තවම දුන්නෙ නෑ. ගෙවල් අහිමි වුන අයට ගෙවල් කුලිය දෙනවා කිව්වා 7,500/- ක්. තවම හම්බ වුනේ නෑ.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*** *Hon.Opposition Whip Siripala Kiriella*
---------------------------------------------------

දෙනවා

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල*** ***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால*** *Hon.Member G.M.Karunapala*
---------------------------------------

දෙනවා, දෙනවා. මේවා ඔක්කෝම අතීත හා අනාගත වාක්‍ය.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*** ***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*** *Hon.Member M.Y.M.Iflar*
------------------------------------------

තවම මාසයක් ගියේ නෑ.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල*** ***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால*** *Hon.Member G.M.Karunapala*
---------------------------------------

ඒක තමයි මම කියන්නේ. දෙනවා නම් සතුටුයි. අපේ මේ ප්‍රකාශ වලින් මේවා ඉක්මන් වෙනවා නම් ඒක තමයි බලාපොරොත්තුවත් අපේ. පරීක්ෂණ වැඩ තවම නිම නෑ. ඇහැළියගොඩ මැතිවරණ කොට්ඨාසයේ ඉඩම්

අනිවාර්යයෙන් දියයුතු 169 ක් තියනවා. තවම හඳුනාගෙන තියෙන්නේ 80 යි. මම මේ

කියන්නේ ගරු මන්ත්‍රීතුමන්ලා තමුන්නාන්සේලාත් කථා කරන්න. කථා කරනකොට ඉක්මන් වෙනවා වැඩ. දැන් පළාත් පාලන ආයතන අද අක්‍රීය කරපු හින්දා ඩෙංගු හා මේ බෝ නොවෙන රෝග, අනෙකුත් කැළි කසළ ඉවත් කිරීම මේවා අඩපණ වෙලා. ඒ නිසා අපි කියන්නේ අපි ඔක්කෝම කෑ ගැහුවොත් , අපි මේ වෙනුවෙන් පෙනී සිටියොත් රජයට මේවා ඉක්මන් කරන්න සිදුවෙනවා. අන්න එතෙන්ටයි අපි වැටිය යුත්තේ. ඒක තමයි ජනතාව අපෙන් බලාපොරොත්තු වෙන්නේ. ඒකයි අපි හඬගාලා මේක කියන්නේ හැම වෙලාවේම.

දැන් බලන්න අද තියන ප්‍රශ්න ටික. තවම හරියට දන්නේ නෑ තමාගේ නිවස අත හැරලා යනවාද ? වෙනත් තැනක් ලැබෙනවාද ? කොයි වෙලාවේ නාය යනවාද ? පහුගිය ටිකේ මේ ශබ්ද විකාශන යන්ත්‍ර දාලා විකාශනයක් කළා 23, 24....

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல* *Hon.Opposition Whip Siripala Kiriella* ---------------------------------------------------

සභාපතිතුමා අපටත් අවස්ථාව දෙන්න කථා කරන්න. මත්පැන් පඹයෙක්.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* *கௌரவ*
*உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member G.M.Karunapala* ----------------------------------------

කථා කරන්න. කථා කරන්න.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස* *கௌரவ*
*எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
-------------------------------------------------------------

ගරු සභාපතිතුමා, මේක පෞද්ගලික ප්‍රකාශයක් නෙමෙයි. එහෙම නම් අපටත් මේවාට උත්තර දෙන්න වෙනවා. අපටත් කථා කරන්න දෙන්න.

(සභාවෙන් ඝෝෂා)

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------------

ගරු කරුණාපාල මන්ත්‍රීතුමා, රම්‍යකුමාර මන්ත්‍රීතුමාට රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ* *கௌரவ*
*உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.Member Ramya Kumara Weerasinghe* ----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ පෞද්ගලික හේතු දැක්වීම කියන රීතිය තියෙන්නේ,

**"සභාවේ කටයුතුවල නියැලීමෙන් ඇති වූ හෝ නියැලීම කෙරෙහි බලපවත්නා වූ හෝ තමන්ට පෞද්ගලික වූ කරුණක් සම්බන්ධයෙන්**

**සභාපතිවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව, ඒ සඳහා ඉඩදෙනු ලබන කාල පරිච්ඡේදය තුළ දී මන්ත්‍රීවරයෙකුට ප්‍රකාශයක් කිරීමට හැකිය.**

**එවැනි ප්‍රකාශයක් ගැන වෙනත් මන්ත්‍රීවරයෙකුට කථා කිරීමට හෝ එම ප්‍රකාශය විවාද කිරීමට හෝ ඉඩකඩ නොතිබිය යුත්තේය. එමෙන්ම මන්ත්‍රීවරයෙකුට වෙනත් මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් ප්‍රකාශයක් කිරීමට නොහැකි විය යුතුය.''**

රීති පොතේ 36.1 රීතිය අනුව මේ සම්බන්ධයෙන්.........

(සභාවෙන් සෝෂා)

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ* ගෞරව
*உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* Hon.Member
*Ramya Kumara Weerasinghe* ----------
---------------------------------------------

මට කියලා ඉවර වෙන්න දෙන්නකෝ. ගරු සභාපතිතුමනි, මට කියන්න දෙන්න. මම කියන්නේ මේ සම්බන්ධ රීතියේ දී තමුන්නාන්සේලා අපි කරුණාපාල මන්ත්‍රීතුමා වේවා , ඔබතුමන්ලා වේවා අපි කවුරු වුනත්, එකක් පෞද්ගලික හේතු දැන්වීම අභියෝගයට ලක් කරමින් ඒකට විරුද්ධව නැගී සිටීම හොඳ නෑ. අනෙක් එක තමයි අපි ඉදිරිපත් කරන කෙනා අපේ හෘද සාක්ෂියට එකඟ ද කියලා මේක තේරුම් අරගෙන ඉදිරිපත් කළයුතුයි. ඒ නිසා මේ කාරණා දෙක දැනගෙන අපි ස්වයංව අපි විසින් කළයුත්තේ කුමක්ද යන්න තේරුම් ගැනීම විනා මේ බොරුවට බෙරිහන් දීලා, රීතියට පිටින් කටයුතු කිරීම ගැලපෙන්නේ නෑ.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්* ගෞරව
*உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* Hon.Member
*M.Y.M.Iflar* ----------
------------------------------

ගරු සභාපතිතුමනි, ඒ රීති ප්‍රශ්නයේම ඔබතුමාව දැනුවත් කරනවා එතුමා ඉතාම හොඳින් ඒ සම්බන්ධයෙන් දැනුවත් කළා. ඒක නිවැරදියි. එතුමා එක දෙයක් කළා, එතුමා ඒකෙම තියන 36.3 එතුමා පොඩ්ඩක් අමතක කරලා කියවනවා. මොකද,

**''සභාපතිවරයා සෑහීමකට පත් වන්නේ නම්, ඒ සඳහා අවස්ථාවක් දියහැකි අතර එවැනි පෞද්ගලික ප්‍රකාශයක් ඉතා කෙටි වියයුතුය.''**

ඉතාමත්ම පැහැදිලිව තේරුම් ගන්න ඕන ඉතාමත්ම කෙටි වියයුතුයි. මේක අපි විවාදයකටවත්, දීර්ඝ ලෙස ගෙනියන්නවත් සභාපතිතුමාගේ අනුමැතිය ගන්නෙ එතුමාට සිද්ධ වෙච්ච පෞද්ගලික යමක් නම් ඒ පෞද්ගලික දේ ඉතා කෙටියෙන් සාරාංශය ඉතාම කෙටියෙන් ප්‍රකාශ කළයුතුයි. එතුමා කියන්නේ මොක්කද? හැල්ලක් කියාගෙන, ආණ්ඩුව විවේචනය කරගෙන, තුන්දෙනෙක් අපහසුතාවයට පත් වුනා, මරණයට පත් වුනා. රුපියල් ලක්ෂය ලැබුණා කිව්වා. 10,000/- ලැබුණා කිව්වා. තව මොනවාද දෙන්න තියෙන්නේ ? එතුමාම කියනවා මරණය සිද්ධ වුනා. ලක්ෂය ලැබුණා. 10,000/- ලැබුණා. මාසයක් යන්න ඉස්සෙල්ලා යමක් වුනා කියලා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------

ඔබතුමා පෞද්ගලික ප්‍රශ්නය කෙටියෙන් ඉදිරිපත් කරලා අවසන් කරන්න.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* *கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member G.M.Karunapala*
-----------------------------------------

ගරු සභාපතිතුමනි, මේ මොකටද රීති හැදුවේ. ප්‍රඥප්ති හැදුවේ මොකටද ? මේ උගත් හා නූගත් මන්ත්‍රීවරුන්ට හැසිරෙන ආකාරය හා ප්‍රකාශ කිරීමේ උපදේශකත්වයක්. ඉතින් ඕක තේරුම් ගන්නේ නැත්නම් මට වැඩකුත් නෑ. ඕක තමයි අපි හැමදාම කියන්නේ. තේරුම් ගන්න. පොතපත කියවන්න. අනෙක් අය කියන එක අහන්න. අවබෝධයක් ලබාගන්න. නිකම්ම කෑ ගහලා වැඩක් නෑ. එහෙම නම් මම කියන්නේ මේකයි, තවම බියෙන් සැකෙන් ජීවත් වෙන පවුල් සංඛ්‍යාවක් ඉන්නවා. ඒ අයට තවම නිශ්චිතව නිගමනයක් දීලා නෑ. මේ ගෙයින් යා යුතුද ? අර ගල එයිද ? අර නාය යයිද ? මේ කිසිම නිගමනයක් දීලා නෑ. අද මානසික ආකල්ප වශයෙන් හෙම්බත් වෙලා සිටින්නේ. මෙන්න මේවාට කඩිනම් විසඳුමක් රජය නොගත්තොත් තමයි ඒක වැරැද්ද. එහෙම නම් අපි මේ හඬගාලා කියන එකෙන් අපේ මේ බුද්ධිමත්, මම මේ කියන එකෙන් අර ඉදිරිපෙළ ඉන්න බුද්ධිමත් මන්ත්‍රීවරු තුන් හතර දෙනා ගිහිල්ලා හරි ආපදා කළමනාකරණ ඇමතිතුමාටයි, ජනාධිපතිතුමාටයි කිව්වා නම් එහෙම මේක විසඳෙයි. ඒක තමයි බුද්ධිය කියන්නේ. ඒක නිසා මම ඉල්ලීමක් කරනවා ...

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------

ඒ කාරණා එකඟයි. ඒ කාරණා සත්‍යයි.

(සභාවෙන් ඝෝෂා)

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* *கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member G.M.Karunapala*
-----------------------------------------

බුද්ධිමත් මන්ත්‍රීවරු දෙපළ, තුන්පළ ගිහිල්ලා ජනාධිපතිතුමාත් එක්කත් කථා කරලා, ආපදා කළමනාකරණ ඇමතිතුමාත් එක්කත් කථා කරලා මේවාට කඩිනම් විසඳුම් ලබාදෙනවා නම් අද දවසේ අපි සතුටු වෙනවා.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස* *கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
-----------------------------------------------------------

මේක අවසන් කරන්න කියන්න.

දරාගන්න පුළුවන් වෙන්න ඕන. විඳ දරා ගන්න බැරි නම් ඒ දේශපාලන ඒ කාරණා අපට යන්න පුළුවන් කමක් නෑ.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------------

මීළඟට ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*
*கௌரவ நமிந்த அனுரபிரிய*
*Hon.Member Naminda Anurapriya*
-----------------------------------------------------------

හරි.....හරි.....කථාව අවසානයි. අවසන් වෙලා තියෙන්නේ. ඒවා ඇහුම්කන් දෙන්න බැරි වුනාට මට කරන්න දෙයක් නෑ ගරු මන්ත්‍රීතුමා. එතුමා කථා කරපු කාරණාව......

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல* *Hon.Opposition Whip Siripala Kiriella*
-----------------------------------------------------

සභාපතිතුමනි, අතිශයින්ම පෞද්ගලික කාරණාවක් කථා කරන්නයි මම සූදානම් වෙන්නේ. මා විසින් ඉදිරිපත් කරපු ලිපියකට කිරිඇල්ල පොලිස් ස්ථානයෙන් නිසි නීතිමය තත්ත්වයක් ඉටු නොවීම පිළිබඳවයි මම පෞද්ගලිකව මේ අවස්ථාව ගත්තේ. ගරු සභාපතිතුමනි, පහුගිය ගංවතුර ඇතිවුන අවස්ථාවේ දී ගංවතුරෙන් කොටු වෙච්ච නිවාස 16 ක් නාය යෑමට සහ ගංවතුරින් කොටු වෙච්ච නිවාස 16 ක් කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මාටුවාගල ග්‍රාම නිළධාරී වසමේ 7 කණුව කියන ප්‍රදේශයේ කොටුවෙලා හිටියා. ගරු සභාපතිතුමනි, මේ අයට යන්න එන්න තැනක් නොතිබුණ අවස්ථාවේ දී මාටුවාගල වැවිලි සමාගමට අයිති රත්කැලි ඇළ කියන ඉඩමට යාබද මායිම්ව මේ පවුල් 16 දෙනා පුංචි කූඩාරමක් අටවාගෙන ඒ ගංවතුර කාල සීමාව අවසන් වෙනතුරු හිටියා. මේ වෙලාවේ දී මා පෞද්ගලිකව කිරිඇල්ල පොලිස් ස්ථානයට, ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කිරිඇල්ල, ඒ වගේම දිස්ත්‍රික් ලේකම් රත්නපුර සහ මාටුවාගල වැවිලි සමාගමේ බලන්ගොඩ ප්ලාන්ටේෂන් ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයාට මම ලිඛිතව ලිපිවලින් ඇරියා මේ අය තාවකාලිකව

ඔබතුමා ස්වාධීනව වැඩ කරන්න.

(සභාවෙන් සෝෂා)

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------------

මම ස්වාධීනව තමයි ඉන්නේ. නමුත් එතුමා කථා කරන්නේ සත්‍ය කාරණාවක් කියලා. ඒ සත්‍ය කාරණාවට තමන්ට මුහුණ දෙන්න බැරි නම් එතන ප්‍රශ්නයක් තියනවා. දේශපාලනය කරනකොට අපට ඒවා විඳ

ගංවතුර අවසන් වෙනතුරු මේ ස්ථානයේ සිටීමට අවසර දෙන හැටියට. හැබැයි ගරු සභාපතිතුමනි, ඊට දවස් තුන හතරකට පස්සේ කිරිඇල්ල පොලිස් ස්ථානයට මේ පවුල් 16 ම කැඳවලා අනවසරයෙන් වැව්ලි සමාගමට අයිති ඉඩමක පදිංචි වෙලා කූඩාරම් ගහගෙන ඉන්නවා කියලා මේ පවුල් 16 ම අරගෙන ගියා පොලීසියට. ඊට පස්සේ ගරු සභාපතිතුමනි,

මේකේ සියළුදෙනාටම නඩු දාන්න කටයුතු කළා කිරිඇල්ල පොලීසියෙන්.

ගරු සභාපතිතුමනි, ගංවතුරට යට වෙලා යන්න එන්න තැනක් නැතුව කොටුවෙලා හිටපු ජනතාව මහ පොළවේ කාටද අයිති කියලා බලන්නේ නැතුව එල්.ආර්.සී. එකට සහ බලන්ගොඩ වැව්ලි සමාගමට අයිති අවුරුදු 60 ක්, 70 ක් වගා නොකරපු ස්ථානයක, රක්ෂිත ප්‍රදේශයක ආරක්ෂිතව පුංචි කූඩාරමක් ගහගෙන හිටපු මේ ජනතාව කිරිඇල්ල පොලීසිය විසින් නඩු දමලා, මේ අයගේ ආපදාව මහා ව්‍යසනයට ලක් වෙච්ච වෙලාවේ කරපු ක්‍රියා මාර්ගය මා තරයේ හෙළා දකිනවා ගරු සභාපතිතුමනි.

ඒ වගේම දැන් ඊයේ වෙනකොට මාසයයි ගංවතුර ගලලා. ගරු සභාපතිතුමනි, මෙන්න ගිය සතිය වෙනකොට මේ ඉඩම මේ ප්‍රදේශයේ ඉන්න මහා බලවතෙකු මේ ආණ්ඩුවේ බලවත් අමාත්‍යවරු අල්ලාගෙන, ආපදාවට ආපු අමාත්‍යවරු රාජ්‍ය බලය යොදමින් මෙන්න මේ ඉඩමේ එක්තරා කොටසක් දැන් කොටු කරගෙන යනවා, මේකේ මැණික් ගැරීමේ කටයුතුවලට. අර අහිංසක පවුල් 16 ක ජනතාව ගංවතුරේ ගසාගෙන මැරිලා යන්න හදනකොට ඉතා අමාරුවෙන් පුංචි කූඩාරමක් අටවා ගෙන ජීවත් වෙන්න තාවකාලිකව ඉල්ලපු අයට නඩු දාලා කිරිඇල්ල පොලීසියෙන් මෙන්න ඒ ඉඩමෙම කැල්ලක් එතනම ජේන මානයේම මෙන්න ඊයේ පෙරෙයිදා ඉදලා, පහුගිය සතියේ ඉදලා කම්බි ගහනවා. මේකද මේ යහ පාලන ආණ්ඩුවේ නීතිය මේකද කියන එක සහ අවතැන් වෙච්ච ජනතාවට සළකන්නේ මෙහෙමද කියන කාරණාව පිළිබඳව අපට ප්‍රශ්නයක් තියනවා. ගරු සභාපතිතුමනි, ප්‍රදේශයේ පළාත් සභා මන්ත්‍රීවරයා හැටියට මේ ස්ථානයට නුදුරුම ප්‍රදේශයේ ඉන්නේ මම. එතකොට මම මන්ත්‍රීවරයා හැටියට ලිපියක් ඉදිරිපත් කළාම මොකක්ද මේකට

සංවේදීතාවයක් දැක්වුවාද ? තාවකාලිකව මිනිසාගේ ජීවිතය ඒ අයගේ ජීවිත ආරක්ෂාවට පුංචි කූඩාරමක් තනාගෙන හිටියා කියලා මේ අයට නඩු දාන්නේ නෑ. කිරිඇල්ල පොලිස් ස්ථානාධිපතිවරයාට කොහෙන්ද ආපු බලය ?

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල* *கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல* *Hon.Opposition Whip Siripala Kiriella* --------------------------------------------------

සභාපතිතුමා, මේක පෞද්ගලිකද ?

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය* *கௌரவ நமிந்த அனுரபிரிய* *Hon.Member Naminda Anurapriya* ----------------------------------------------------------

පෞද්ගලිකව මම කිරිඇල්ල පොලිසියට ඉදිරිපත් කරපු මගේ ලියවිල්ලට මට අවශ්‍ය සහනය ලැබුනේ නෑ. නීතිය අවනීතිය වෙලා. ඒ නිසා මට පෞද්ගලික කාරණාවක් මේ කාරණාව. මෙතනදී එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ සියළු ජනතාව පක්ෂ භේදයකින් තොරව තමයි ගංවතුරට අහුවුනේ. මේකට පක්ෂ පාට භේදයක් නෑ. කූඩාරම් ගහගෙන හිටපු තැන හිටියෙත් එක්සත් ජාතික පක්ෂයේ ශාඛා සමිතියේ සභාපතිත් ඔය

කූඩාරමේ හිටියා. නමුත් ඒ සියළුදෙනා වෙනුවෙන් පෞද්ගලිකව මේ නමින්ද අනුරප්‍රිය ලියුමක් යැව්වේ කිරිඇල්ල පොලිසියේ ස්ථානාධිපතිතුමාට. හැබැයි ඒ පවුල් 17 ට නඩු 17 යි. මෙන්න ඊයේ පෙරෙයිදා වෙනකොට ආණ්ඩුවේ බල පුළුවන්කාරකම අරගෙන මෙන්න ඉඩම කොටු කරනවා මැණික් ගරන්න. එතකොට බලන්ගොඩ වැව්ලි සමාගම කියනවාලු අනේ මෙහෙම කොහොමද අපට අයිති ඉඩම් මෙහෙම කොටු කරන්නේ කියලා. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, මම

ඉල්ලන්නේ මගේ පෞද්ගලික ඉල්ලීමක් යටතේ ඉදිරිපත් කරපු ලිපියට සහ ඒ ජනතාවට සාධාරණයක් ඉෂ්ඨ වුනේ නෑ. ඒක තමයි මගේ පෞද්ගලික ප්‍රකාශය ගරු සභාපතිතුමනි. මේක ආණ්ඩුවට ගහන එකක්වත්, කාටවත් ගහන එකක් නෙමෙයි. වදින කට්ටියට වදියි. හැබැයි ජනතාවට සාධාරණය ඉටුවෙච්ච නැති එක පිළිබඳව සහ මම ඉදිරිපත් කරපු පෞද්ගලික ලිපියට කිසිඳු සේවයක්, කිසිම තැකීමක් කරපු නැති එක පිළිබඳව මගේ බලවත් විරෝධය මම පළ කරනවා ගරු සභාපතිතුමනි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------

නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමාට ස්තුතියි. ඒ වගේම ඒ අදාළ යෝජනාව සභාවේ අවධානය යොමු කරලා, ඒ වගේම අදාළ අංශවලට යොමු කරලා සාධාරණයක් ඉටු කිරීම සඳහා යොමු කරනවා.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*** ***கௌரவ***
***உறுப்பினர் ரம்ய குமார வீரசிங்க*** *Hon.Member Ramya Kumara Weerasinghe*
----------
---------------------------------------------

ගරු සභාපතිතුමනි, දැන් ඔබතුමාගේ මේ සභාවේ කටයුතු කිරීම සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරු යම් යම් ප්‍රකාශ කරපු නිසා මම මේ කියන්නේ. ඔබතුමා පහුගිය සභාවේ දී මම ඉතා දැඩි ලෙස හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න එපා කියපු ප්‍රකාශය ඔබතුමා ඔබතුමාගේ සභාපති බලතල පාවිච්චි කරලා මම කථා කරපු එකේ මම ඉවත් කරන්න එපා කියපු කොටසත් ඔබතුමා ඒ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරලා තියනවා. ඒ සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් අපට නෑ.

මොකද ඔබතුමා සභාපතිවරයා හැටියට කිසිම පක්ෂ භේදයක් නැතුව ඔබතුමාගේ කටයුත්ත හරියට කළා කියන එකයි ඒකෙන් පැහැදිලි වෙන්නේ. එහෙම කටයුතු කරද්දිත් ඔබතුමාට විරුද්ධව මේ ආකාරයෙන් කථා කිරීම ඉතාම කණගාටුදායකයි කියන එක මම ප්‍රකාශ කරනවා.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස*** ***கௌரவ***
***எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*
---------------------------------------------------------

සභාපතිතුමනි, අපි ඔබතුමාට විරුද්ධව නෙමෙයි කථා කරන්නේ. අපි මෙතන කථා කරන්නේ මන්ත්‍රීවරු යන මග නිවැරදි වෙන්න ඕන.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------

ඔබතුමන්ලාත් මේ සභාවට ආවේ අද නෙමෙයි. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නකොටත්, ඒ වගේම ආණ්ඩු පක්ෂයේ ඉන්නකොටත් මේ කාරණා සම්බන්ධව මීට

වඩා වාද විවාද වෙලා තියන අවස්ථාවල් තියනවා. හැබැයි එදා අපි දේශපාලන වශයෙන් ඒවාට මුහුණ දෙන්න පුළුවන් හයියක් තිබුණා. තර්ක විතර්ක කළා. යෝජනා ගෙනාවා. සභාවේ පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කරපුවාම පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කරලා ඒවා අපට විසඳා ගන්න බැරි නම්, ප්‍රශ්නයක් තියනවා නම් ආපහු ඊළඟ සභාවට අපි යෝජනාවක් දාලා ඒ සම්බන්ධව තර්ක විතර්ක කරන්න පුළුවන්කම ලැබුණා. නමුත් අද ඒවා විඳ දරාගන්න පුළුවන් කම ලැබුනේ නෑ කියලා තමයි අපට පේන්නේ. ඒ නිසා ප්‍රශ්නයක් තියනවා. ඊළඟට මේ

පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ, සභාපතිතුමාට මේ කාරණා ඉදිරිපත් කරලා, සභා කටයුතු කාරක සභාවට ඉදිරිපත් කරලා ඒ යෝජනාව පිළිබඳව එහෙම නම් මේ කාලය විතරයි, කාලය ඉල්ලන්නෙ නැතුව ඒක ප්‍රශ්නයක් හැටියට මොකක්ද කියලා පැහැදිලි කරලා දෙනවා නම් මම දන්නවා ප්‍රශ්නය මොකක්ද කියලා. එතකොට ප්‍රශ්නය මම දන්නේ නෑ මොකක්ද කියලා. ඒක ඉදිරිපත් කළාට පස්සේ තමයි මමත් ප්‍රශ්නය දන්නේ. ඒ නිසා මේකයි තත්ත්වය. ඒ නිසා මීළඟට,

**කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම : නැත**

**පෙත්සම් : නැත**

**ප්‍රශ්න : නැත**

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ : නැත**

**ශෝක ප්‍රකාශ යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා : නැත**

**පළාත් සභාවේ පොදු කටයුතු :**

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සභාගත කිරීම සහ අනුමැතිය ලබාදීම. ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සාකච්ඡා කිරීම සඳහා අවස්ථාව ලබාදෙනවා, මේ යටතේ ගරු ඇමතිතුමාට.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර.*** ***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார*** *Hon. Minister Ranjith Bandara*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි, න්‍යායපත්‍රානුකූලව කටයුතු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, 2017 ග්‍රාම සංවර්ධන සංශෝධිත ප්‍රඥප්තිය ගරු සභාවේ මන්ත්‍රීතුමන්ලාට ඉදිරිපත් කරලා තියනවා. ගරු සභාවට ඉදිරිපත් කරලා තියනවා. අපි ඒ සම්බන්ධව ගරු සභාවේ එකඟතාවය මේ ගරු සභාවෙන් ලබාදෙන ලෙස ඔබතුමන්ලාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***

*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------

සභාවට ඉදිරිපත් කරලා තියනවා. ඒ වගේම සංශෝධන යෝජනාත් මේ වෙලාවේ ඉදිරිපත් කරලා තියනවා. ඒ අනුව සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවස්ථාවක් ලබාදෙනවා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම***
***கௌரவ உறுப்பினர் அஜித் குமார மெத்தேகம***
*Hon.Member Ajith Kumara Meddegama*
---------------------------------------------------------------

ගරු සභාපතිතුමනි මූලාසනයට ස්තූතිවන්ත වෙනවා පසුගිය සභා වාරයේ අපේ ඉල්ලීම පරිදි සංශෝධනයට ප්‍රඥප්ති කාරක සභාවේ ඒ සංශෝධන ඉදිරිපත් කරලා නැවත සංශෝධිත ප්‍රඥප්තියක් ඉදිරිපත් කිරීම සම්බන්ධව. ඒ එක්කම මේ සඳහා සංශෝධනයක් ඉදිරිපත් කරන්න කැමතියි. මොකද මේ ප්‍රඥප්ති ඉතා කාලෝචිතයි ඉතා සුදුසුයි.

ගරු සභාපතිතුමනි 5(ආ) මේ කමිටුවක් සඳහා හත් දෙනෙක් පත් කරන්න ඕනේ කියලා තියෙනවා. ඒක හරි. ඒවගේම ඒ සභාවේ ගණපූරණය ගැන මේකේ සඳහන් කරලා නෑ. ඒ නිසා ගණපූරණය මේ ප්‍රඥප්තියට අනිවාර්යයෙන්ම ඇතුළත් කළ යුතු වෙනවා.

දෙවෙනි කාරණාව පළාත් සභාවේ විෂයභාර අමාත්‍යවරුන් පස් දෙනාගේ නිර්දේශය පරිදි එක් සාමාජිකයෙකු බැගින් සාමාජිකයින් පස් දෙනෙකු මෙම පස් දෙනා රාජ්‍ය නිළධාරියෙකු හෝ විෂය පිළිබඳ දැනුම ඇති නිළධාරීන්ගෙන් විය යුතුය. මේ සඳහා මම යෝජනා කරනවා මේ විෂයභාර අමාත්‍යවරයාට මීට වඩා බලයක් දිය යුතුයි කියන එකයි මගේ පුද්ගලික අදහස සහ අපේ කණ්ඩායමේ. විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශයට නිළධාරීන් දෙදෙනෙකුත් මුදල් විෂයභාර හා අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශයට තුන් දෙනෙකුත් සාමාජිකයෝ පත් විය යුතුයි කියලා සංශෝධනයක් ඉදිරිපත් කරනවා. ගණපූරණය පිළිබඳව මේකේ සඳහනක් අවශ්‍යයි. ඒවගේම මේ සංයුතිය ග්‍රාම සංවර්ධන විෂයභාර

අමාත්‍යවරයට සාමාජිකයින් දෙදෙනෙක් සහ මුදල් විෂයභාර අමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශය මත තුන් දෙනෙක් පත් විය යුතුයි කියලා එතකොට හතයි. හත වෙනස් වෙන්නේ නෑ. ඒ එක්කම ගණපූරණය අවම වශයෙන් තුන් දෙනෙක්වත් සිටිය යුතුයි කියලා ඒ සංශෝධන වෙන්න ඕනේ කියලා යෝජනා කරනවා.

ඒවගේම ගරු සභාපතිතුමනි මේ ප්‍රඥප්තිය ඉතා වැදගත් යෝජනා රාශියක් එකතු වෙලා තියෙනවා. මං හිතන්නේ දැන් තියෙන ප්‍රඥප්තිය අනුව ග්‍රාම සංවර්ධන විෂය ඒ තරම්දුරට ඔබතුමාට අධීක්ෂණය කරන්න පරීක්ෂණය කරන්න තියෙන හැකියාව අඩු වෙලා. නමුත් මේ තුළ ඒ සඳහා පූර්ණ බලයක් හිමි වෙනවා. ඉතාම වැදගත්. ඒ එක්කම ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරන්න මට ඒක පැහැදිලි කිරීමක් නැතිද මන්දා. 5(අ) රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්ක සඳහා වෙන වෙනම දිස්ත්‍රික් අරමුදල් දෙකක් අපි එක අරමුදලක් තිබුණොත් හොඳයි කියලා පළාත් සභාවට. ඒකේ (අ) තියෙනවා රත්නපුර සහ කෑගල්ලට වෙන වෙනම අරමුදල් දෙකක් පවත්වාගෙන යාමට හැකියි. එම අරමුදල් පහත සඳහන් ප්‍රභවයන්ගෙන් සමන්විතය. මේ සඳහා එක් අරමුදලක්. මොකද මේකට මුදල් වෙන්

කරන්න තියෙන්නේ පළාත් වාර්ෂික මුදල් ප්‍රකාශය. රජය මගින් ලබා දෙන ප්‍රතිපාදන , යම් පුද්ගලයෙක් හා ආයතනයක් මගින් ලබාදෙන ප්‍රතිපාදන මේක දෙකකට දෙන්නට ගියහම ප්‍රශ්නයක් වෙන්නට පුළුවන්. සමහර රත්නපුර දිස්ත්‍රික්කයේ ධානපතියෝ වැඩි වුණොත් ඒ අයට අසාධාරණයක් වෙන්නට පුළුවන්. කෑගල්ල දිස්ත්‍රික්කයේ ධානපතියෝ වැඩි වුණොත් රත්නපුර දිස්ත්‍රික්කයට අරමුදලක් හැටියට සංශෝධනය වෙන්න ඕනේ කියලා එසේ ඒ සංශෝධන වලට යටත්ව අපේ අනුමැතිය ලබා දෙන්න සූදානම්.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ------------------------------------------------------------------------------------------

බොහොම ස්තුතියි මන්ත්‍රීතුමනි. අපේ ඇමතිතුමාට අවස්ථාව.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස* *கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
-------------------------------------------------------------

මේ සංශෝධන වලට යටත්ව අපි අනුමැතිය දෙනවා ඔබතුමාට ඒ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ------------------------------------------------------------------------------------------

අවස්ථාව ලබා දෙනවා ගරු ඇමතිතුමාට මේ සංශෝධන සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීමට.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර*
*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara* -------------------------------------------------------

ගරු සභාපතිතුමනි මම ස්තුතිවන්ත වෙනවා කාලෝචිත ප්‍රඥප්තියක් හැටියට ඒ සංශෝධන අපි පිළිගන්නවා. ඒ සංශෝධනත් සමඟ සභාව සම්මත කර දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා .

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ------------------------------------------------------------------------------------------

බොහොම ස්තුතියි ගරු අමාත්‍යතුමනි. මේ අවස්ථාවේ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්ති කෙටුම්පත සභා සම්මත කිරීම හා අනුමැතිය ලබාගැනීමේ අවස්ථාව. ඒ සඳහා සංශෝධනවලට යටත්ව සභාවේ ඒකමතික අනුමැතිය ලැබෙනවා. ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා . සියළු දෙනාටම සහයෝගය කාලයක් තිස්සේ බලාපොරොත්තු වුණේ ඒ ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීම හා සම්මත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සම්බන්ධව.

මීළඟට අංක 15

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු:**

15.1

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ* *கௌரவ*
*உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.Member*
*Ramya Kumara Weerasinghe* ----------
----------------------------------------------

මට ඊට ඉස්සෙල්ලා පුංචි රීති ප්‍රශ්නයක් දැනුවත් වෙන්න ඉල්ලීමක් කරනවා. ගරු සභාපතිතුමනි අපේ ජයතිස්ස රණවීර මැතිතුමාට නිවාඩුවක් ඉල්ලුවා ඉෆ්ලාර් මන්ත්‍රීතුමා. එතකොට අපේ ජයතිස්ස ඇමතිතුමාට නිවාඩු අනුමත වෙච්චි මන්ත්‍රීවරයෙක් හැටියට සටහන් වෙන්නේ. රීති පොතේ ඒ ගැන කිසිම දෙයක් නෑ. මම මේ අපේ ඇමතිතුමාට අසාධාරණයක් වෙයි

කියලා. එතුමා දැන් මේ සභාවේ ඇවිල්ලා වාඩි වෙලා ඉන්නවානේ. එතකොට මෙවැනි අවස්ථාවක් සම්බන්ධයෙන් රීති පොතේ කිසිම තැනක ඒ සම්බන්ධ සටහනක් නෑ. එහෙම නිවාඩු අනුමත කළාට පස්සේ මන්ත්‍රීවරයෙක් ආපුවහම ඒ අනුමත කරපු නිවාඩුව අවලංගු වෙනවාද. මොකක්ද වෙන්නේ කියන එක අපිට දැන ගන්න අවශ්‍යයි. හදිස්සියේ එහෙම නැත්නම් ගරු මන්ත්‍රීතුමා ඇවිල්ලා වාඩි වෙලා එතුමා මේ සභාවේ ඉන්නවා. එතුමා දන්නේ නෑ මෙහේ නිවාඩු අනුමත වෙලා. එතුමා නොදැනුවත්ව. ඒ නිසා නිවාඩු අනුමත කළා කියන එක තුළ එතුමා නිවාඩු ගත්ත මන්ත්‍රීවරයෙක් හැටියට සටහන් වෙන්නේ. ඒක සභාව පවත්වාගෙන යාමේදී සමහරවිට ප්‍රශ්නයක් වෙන්නට පුළුවන්. ඒ නිසා මම පොඩි ඉල්ලීමක් කරනවා නැවත රීති හදන කොට අපි මේ සම්බන්ධව වන කාරණාවත් මේ රීතියට ඇතුලත් කරලා ඒක සංශෝධනය කරන්න. ඒක ඊළඟ අවස්ථාවේදී.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman*
*Udayakantha Gunathilaka* ------------------------------
-------------------------------------------------------------

ඒක මෙහෙමයි ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය තියෙන්නේ. මන්ත්‍රීතුමාට නිවාඩු ඉල්ලුවා. අනුමත වුණා. නමුත් මන්ත්‍රීතුමා අත්සන කරපුවහම ආපහු අර යෝජනාව අවලංගු වෙනවා. නමුත් මේ කාරණාව මම මීට ඉස්සෙල්ලාත් දැක්කා. ඒ නිවාඩුව ඉස්සෙල්ලාත් ඉල්ලුවා. මන්ත්‍රීතුමා සභාවට ආවා. අදත් ඒ ප්‍රශ්නයම ඇති වුණා. මේ ඉතිං හොරාට ඉස්සෙල්ලා කෙහෙල් කැන වැට පනිනවා වගේ වැඩක්.

*ගරු මන්ත්‍රී ජයතිස්ස රණවීර*
*கௌரவ உறுப்பினர் ஜயதிஸ்ஸ ரணவீர* *Hon.Member*
*Jayathissa Ranaweera* ----------
----------------------------------------------

ඔබතුමා මේ සභාවට පත් වෙලා කොච්චර කල්ද?

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ* *கௌரவ*
*உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.Member*
*Ramya Kumara Weerasinghe* ----------
----------------------------------------------

ඒක දන්නේ නැතිකම නෙමෙයි ගරු මන්ත්‍රීතුමා මම කිව්වේ මේක නිවාඩුවක් ඉල්ලන කොට මන්ත්‍රීවරයෙක් තව කෙනෙකුට ඒ මන්ත්‍රීවරයා දැනුවත්ව ඒ ඉල්ලීම කරන්න ඕනේ. එහෙම නැතුව මේ කවුරුත් දන්නේ නැතුව නිවාඩුව ඉල්ලනවා

. නිවාඩු ඉල්ලපු මන්ත්‍රීවරයා මෙතෙන්ට එනවා. සභාවේ නිවාඩුවක් ඉල්ලන කොට එක්කෝ මන්ත්‍රීවරයා විසින් ලිඛිතව ඉල්ලන්න ඕනේ. එහෙම නැතුව ඒ මන්ත්‍රීවරයාගේ අනුදැනුම ඇතුව වෙනත් මන්ත්‍රීවරයෙක් විසින් ඒක කරන්න ඕනේ. ඒ මන්ත්‍රීවරයාගේ අනුදැනුම ඇතිව කළා නම් පස්සේ එතුමාට සභාවට එන්න ක්‍රමයක් නැනේ. තර්කයක් ගොඩ නගලා මේ කාරණාව කියනවා නෙමෙයි. යමක් කරන කොට වගකීමෙන් කරන්න ඕනේ. ඉෆ්ලාර් මන්ත්‍රීතුමා ඒ වගකීම පැහැර හැරලා තියෙනවා . ඒක හරියට දන්නේ නැතුව තමයි වැඩේ කරලා තියෙන්නේ.

ඒක අපි නිවාඩු දෙනවා. අපි අසනීප වෙනවා. සනීප වෙනවා. එනවා. ඒක මේ ආපහු සභාවේ සම්මත කළා කියලා මට මේකට එන්න තහනමක් නෑ. ඇවිල්ලා අත්සන් කිරීමේ අයිතිය තියෙනවා. ඒක දන්නේ නැති මන්ත්‍රීවරු සභාවේ සිටීම ගැන අපි කණගාටු වෙනවා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ------------------------------
------------------------------------------------------------

ගරු ඇමතිතුමාට අවස්ථාව දෙන්න.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ------------------------------
------------------------------------------------------------

රීති ප්‍රශ්නයක් අහන්න එතුමාට අයිතියක් තියෙනවානේ. එහෙම නැතත් එතුමා අත්සන් කරපුවහම ඒක බල රහිත වෙනවා ඒ යෝජනාව.

*ගරු මන්ත්‍රී ජයතිස්ස රණවීර*
*கௌரவ உறுப்பினர் ஜயதிஸ்ஸ ரணவீர* *Hon.Member Jayathissa Ranaweera* ----------
--------------------------------------------

ගරු සභාපතිතුමනි එවැනි ඉල්ලීමක් කිරීමේ අවශ්‍යතාවයක් නෑ. මම සභාවට ඇවිල්ලා අත්සන් කළාම ඒක ඔටෝමැටික් නැති වෙනවා. ඒක සාමාන්‍ය සම්ප්‍රදායක්.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* *கௌரவ அமைச்சர் அதுல குமார ராஹுபத்த* *Hon. Minister Athula Kumara Rahubadda*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි පාර්ලිමේන්තු සම්ප්‍රදායයි රීති සම්ප්‍රදායයි දෙකක්. නමුත් එතුමා ඇහුවේ සත්භාවයෙන් මොනවා හරි අහන්න ඇත්තේ. නමුත් මේකේ වගකීම දරන්න ඕනේ අදාල මන්ත්‍රීවරු එතුමා එනවද නැද්ද කියලා හොයන්න ඕනේ. නැත්නම් මේක සභාව විහිළුවක්. මේ විහිළුවට ගන්න බෑ. ගරු මන්ත්‍රීතුමා කාට හරි කියන්නේ නැතුව මහ පිටත් වෙන වෙලාවට නිවාඩු අනුමත කෙරුවේ. එහෙම කෙරේ කොහොමද. එතුමාට කරපු අසාධාරණයක් ජයතිස්ස රණවීර ගරු මන්ත්‍රීතුමාට. ඒ නිසා එතුමා දැනුම්දීම හෝ නොදීම එතුමාගේ යුතුකමක්. හැබැයි ඒ වෙනුවෙන් කටයුතු කරනවා නම් අදාල කාරණාව ආණ්ඩු

පක්ෂයේ සංවිධායකවරු විපක්ෂයේ සංවිධායකවරු මේක දැනුවත් වෙන්නට ඕනේ. එහෙම නැතුව මේ සභාවේ ඉඩ තියෙනවාට නම් ටික යෝජනා කරනවා. ඒ නිසා මම කියන්නෙ මේක පළවෙනි වතාවට හෝ අවසාන වතාවට මෙතනින් හමාර විය යුතුයි. පාර්ලිමේන්තු සම්ප්‍රදාය හා සමගාමීව යන වැඩ සටහනක් අපි. ඒ නිසා කාරණාව බරපතලයි. ඒ නිසා ඇහුවේ එතුමාට අසාධාරණයක් ස්ථිරවම. එතුමා පිටත් වෙලා මෙහේ එන්න ඇඹිලිපිටිය කියන්නේ කිලෝමීටර් 50 කටත් එහා.

*ගරු මන්ත්‍රී ජයතිස්ස රණවීර*
*கௌரவ உறுப்பினர் ஜயதிஸ்ஸ ரணவீர* *Hon.Member*
*Jayathissa Ranaweera* ----------
---------------------------------------------

කිලෝමීටර් 50 කටත් එහා ඉඳලා මම පිටත් වෙනවා. මගේ වාහනය මහ කැඩෙනවා. පොඩ්ඩක් අහගන්න මන්ත්‍රීතුමා.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* *கௌரவ*
*அமைச்சர் அதுல குமார ராஹூபத்த* *Hon. Minister*
*Athula Kumara Rahubadda*
-------------------------------------------------------

මේක පටලවගන්න එපා. ඔබතුමා කිව්වද?

*ගරු මන්ත්‍රී ජයතිස්ස රණවීර*
*கௌரவ உறுப்பினர் ஜயதிஸ்ஸ ரணவீர* *Hon.Member*
*Jayathissa Ranaweera* ----------
---------------------------------------------

මම කිව්වා.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* *கௌரவ*
*அமைச்சர் அதுல குமார ராஹூபத்த* *Hon. Minister*
*Athula Kumara Rahubadda*
-------------------------------------------------------

ඒක හරි එතුමා කිව්වා නම් තමුන්නාන්සේ කෙරුවේ වැරැද්දක්. ඒක පිළිගන්න. පාර්ලිමේන්තු ගිය මන්ත්‍රීවරයෙක් හැටියට. ගරු සභාපතිතුමා මෙතුමාට ඕන ඕන එක කරන්න දෙන්න බෑ. (ඝෝෂාව) තමුන්නාන්සේ පාර්ලිමේන්තුවේ හිටිය මන්ත්‍රීවරයෙක් ඇමතිවරයෙක්. කොහොමද මේක අස්සට එන්නේ.

*ගරු මන්ත්‍රී ජයතිස්ස රණවීර*
*கௌரவ உறுப்பினர் ஜயதிஸ்ஸ ரணவீர* *Hon.Member*
*Jayathissa Ranaweera* ----------
---------------------------------------------

ඇයි බැරි.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* *கௌரவ*
*அமைச்சர் அதுல குமார ராஹூபத்த* *Hon. Minister*
*Athula Kumara Rahubadda*
-------------------------------------------------------

එහෙම එන්න බෑ. මේක අම්මගේ අප්පගේ බූදලය නෙමෙයි. එන්න බෑ මේ සභාවේ. තමුන්නාන්සේට එහෙම කරන්නත්

බෑ. මේ බබාලා වෙන්න එපා ඉෆ්ලාර් මන්ත්‍රීතුමා. එතුමා හිටියේ නෑ තමුන්නාන්සේලා අපි සභාවේ හිටියේ අවුරුදු හතරක්. හතර වතාවක්. සභාවක් තියෙනවා ගරු සභාපතිතුමා. එහෙම පොතේ කොහේවත් නෑ. එහෙම ගරු මන්ත්‍රීතුමා එක එක්කෙනාට ඕන ඕන විදිහට එන්නයි. නිවාඩු දාන්නයි නිවාඩු අවලංගු කරන්නයි සභාවක් මොකටද. සභාවක් අනුමත කරපු එක අවලංගු කරන්න බෑ ගරු මන්ත්‍රීතුමා. මේ ගරු සභාපතිතුමා සභාවක් නිවාඩු අනුමත කළේ. මෙහෙම තනි පුද්ගලයෙකුට කරන්න බෑ. සභාවක් අනුමත කරපු එකක් විහිළුවට ගන්නේ. (සභාවේ ඝෝෂාව)

*ගරු සභානායක අසෝක ජයවර්ධන*
*கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
*Hon.Gov.Whip Asoka Jayawardane*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි ඉතාම සුළු අතපසුවීමක් නිසා මේ කතන්දරය ඔක්කෝම

සිද්ධ වුණේ මං හිතන්නේ. මම දැක්කා ඉෆ්ලාර් මන්ත්‍රීතුමා නැගිට්ටා . ඔබතුමා කතා කරන වෙලේ. එතුමා කිව්වා. එතුමාගේ මයික් එක ඕන් වුණේ නෑ. එතුමා පැමිණ ඉන්නවා කියලා කියන්න හැදුවා. මම දැක්කා. එතුමා ඒ වෙලාවේ කියලා තිබුණා නම් ප්‍රශ්නයක් සිද්ධ වෙන්නේ නෑ.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර් கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

මීට වඩා සම්බන්ධීකරණයක් තියෙන් ඕනේ සභාවක්.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka*
--------------------------------------------------------------------------------------------

මේ ප්‍රශ්නය මෙතනින් ඉවරයි. මේ සම්බන්ධව නොවෙන්න මන්ත්‍රී තුමන්ලාගේ වගකීම සභාවේ වගකීමයි.

*ගරු සභානායක අසෝක ජයවර්ධන*
*கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
*Hon.Gov.Whip Asoka Jayawardane*
-----------------------------------------------------

මන්ත්‍රීතුමන්ලාගේ ගෞරවය ආරක්ෂා වෙන්න ඕනේ.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka*
--------------------------------------------------------------------------------------------

ගරු මන්ත්‍රීතුමා දැන් මේ ප්‍රශ්නය ඉවර කරමු.

*ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய* *Hon. Minister Bhanu Munipriya*
--------------------------------------------------

නෑ ප්‍රශ්නය ඉවර නෑ. දැන් ඔබතුමා කියන්නේ කෙනෙක් නිවාඩු අනුමත කළාට පස්සේ පළාත් සභාව ඇතුළට එන්න බෑ කියලාද?

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* -------------------------------
----------------------------------------------------------------

නෑ පුළුවන්.

*ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය* *கௌரவ*
*அமைச்சர் பானு முனிப்பிரிய* *Hon. Minister Bhanu Munipriya* -----------------
-------------------------------------------

මේවා හරියට හදා ගන්න. මේවා හදා ගත්තේ නැත්නම් මට දැන් අසනීපයක් වෙනවා . නමුත් වටිනවා මේක හදා ගන්න. හදා ගන්නේ නැතුව මේක කරන්න බෑ.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* *கௌரவ*
*அமைச்சர் அதுல குமார ராஹூபத்த* *Hon. Minister Athula Kumara Rahubadda*
---------------------------------------------------------

පාර්ලිමේන්තු ගිය මන්ත්‍රීවරු කීප දෙනෙක්ම ඉන්නවා. මට කියන්නකෝ පුළුවන්ද කියලා. තමුන්නාන්සේ පාර්ලිමේන්තු ගියේ නැනේ. තමුන්නාන්සේ නොගිය එකේ වරද තමයි මේ කළේ. අජිත් කුමාර ගරු මන්ත්‍රීතුමා කියන්නකෝ පාර්ලිමේන්තුවේ එහෙම දෙනවද කියලා.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම*
*கௌரவ உறுப்பினர் அஜித் குமார மெத்தேகம*
*Hon.Member Ajith Kumara Meddegama*
---------------------------------------------------------

පළාත් සභාවේ වෙච්චි සිද්ධියක් මම මතක් කරන්නම්. කරුණාපාල ගරු මන්ත්‍රීතුමාට නිවාඩු අනුමත කළා. එතුමා සභාවට පැමිණියා. දැන් මාසයකට පමණ උඩදී. නිවාඩුවක් අනුමත කිරීමක් සම්බන්ධයෙන් මේ පළාත් සභාවේ ප්‍රඥප්තියේ හෝ රීති මාලාවේ කිසි තැනක සඳහන් වෙලා නෑ. මේකේ තියෙන්නේ නොදන්නවා පළාත් සභාවට නොපැමිණියොත් තුන් මාසයකදී මන්ත්‍රී ධූරය අහෝසි වෙනවා කියලා විතරයි. එතකොට යම්කිසි මන්ත්‍රීවරයෙක් ගරු ඇමතිතුමා කියපු කතාවේ සත්‍යතාවයකුත් තියෙනවා. හැබැයි මෙහේ සම්ප්‍රදායක් හැටියට නිවාඩු අනුමත කරන්න කියලා කිව්වොත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නැගිටලා අහවල් අහවල් මන්ත්‍රීවරුන්ගේ නම් ටික කියලා කියනවා. විපක්ෂයෙන් කියනවා. එතකොට සමහර වෙලාවල් වලට ඒ මන්ත්‍රීවරයා පැමිණ තිබෙනවා. එතකොට සමහරවිට මාස තුනක් විතර මන්ත්‍රීවරයෙක් පැමිණිලා නොතිබුණොත් ඒ මන්ත්‍රී ධූරය අහෝසි වුණොත් කියලා ඒක සානුකම්පිතව බලලා නම ඉදිරිපත් කරනවා. ඒක සභාවට පැමිණියාම මන්ත්‍රීවරයෙකුගේ නිවාඩු අහෝසි වෙනවා. ඒක තමයි ක්‍රමය. මෙතුමා සාක්ෂි දරයි ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙක්. ඒක තමයි සම්ප්‍රදාය.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* -------------------------------
----------------------------------------------------------------

මේක දිගට අරන් යන්න අවශ්‍ය කාරණාවක් නෙමෙයි. මම ඒක සභා කටයුතු කාරක සභාවට යෝජනා කරලා මේක මෙතනින් එහාට කතා කරන්න එපා. සභා කටයුතු කාරක සභාවට ඉදිරිපත් කරලා ඒ සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ගය පිළිබඳව ඊළඟ සභාවට දැනුම් දෙනවා. එහෙම තමයි ඉතිහාසයේ තිබුණේ. ඒ සම්බන්ධ වෙනස් නොවෙන තත්ත්වයක් ඉදිරිපත් කරනවා ඊළඟ සභාවට. මේ විදිහට විය යුතුයි කියලා.

***ගරු මන්ත්‍රී නිලන්ත ජයසිංහ***
***கௌரவ நிலந்த ஜயசிங்க***
*Hon Member Nilantha  Jayasighe*
--------------------------------------------------------------------------------------------

යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා විසින් අදාල යෝජනාව ඉල්ලා අස් කර ගත්තා නම් මේ ගැටළුව නිරාකරණය වෙනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*** *Hon.D.Chairman Udayakantha Gunathilaka* ------------------------------------------------------------------------------------------

15.1 ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ යෝජනාව . එතුමාට අවස්ථාව ලබා දෙනවා මේ යෝජනාව ඉදිරිපත් කිරීමට.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*** *Hon.Opposition Whip Siripala Kiriella* -----------------------------------------------------

ගරු සභාපතිතුමනි සබරගමුව පළාතේ සමූපකාර සමිතිවල සභාපතිවරුන්ට සමිතියේ ලාභය අනුව දීමනාවක් ගෙවීම සිදු කරනු ලබයි. මෙසේ ඉහළ ලාභයක් ලැබීම සඳහා සමිති මෙහෙයවීමේදී උපසභාපතිවරුන්ගේ දායකත්වය ද විශාල වශයෙන් බලපානු ලබන බව දක්නට ලැබේ.

ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අධීක්ෂණය හා පාලනය යටතේ පවත්නා සමූපකාර විෂයට අදාල සමූපකාර සමිති අතරතින් වැඩි ප්‍රමාණයක් විශාල ලාභයක් සහිතව පවත්වාගෙන යනු ලබයි. ඇතැම් සමිති මේ වනවිට සේවක වැටුප් ඉහළ මට්ටමක තබා ඔවුන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කොට ඔවුන්ට ලබාදී ඇති තෘප්තියත්,සේවකයින් විශ්‍රාම වැටුපට යටත් කොට ලබාදී ඇති රැකවරණයත් පිළිබඳව සේවකයින් අතිශයින් අගය කරති.

මෙම කරුණු අනුව සලකා බලා යම් මට්ටමක ඉහළ ප්‍රගතියක් පෙන්වනු ලබන සමිතිවල උපසභාපතිවරුන්ට ද අවම වශයෙන් මසකට රු.10,000/- දීමනාවක් ලබාදීමට කටයුතු කළ හොත් එය සමිතිවල ක්‍රියාකාරිත්වය තවදුරටත් වර්ධනවීමටත්, උපසභාපතිවරුන්ගේ සේවය තවත් උපරිමයෙන් සභාපතිවරුන්ට සහ සමිතියට ලබාගැනීමටත් හේතුවන අතර, ඔවුන් දිරිමත් කිරීමක් ද වනු ඇත.

එබැවින් දැනට සභාපති දීමනාව සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛය පදනම් කර

ගනිමින් ඉහළ ආදායම් ලබන සමිතිවල සාර්ථකව කටයුතු කරන උපසභාපතිවරුන්ට ද මසකට දීමනාවක් ලබාදීම සුදුසු බවට මම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි විවිධ සේවා සමූපකාර සමිති ගත්තහම අද රත්නපුර දිස්ත්‍රික්කයේ කීපයක්ම ඉහළ මට්ටමේ පවතිනවා. විශාල වර්ධනයක් තියෙනවා. දියුණුවක් තියෙනවා මේ සමිතිවල. පෙළක් සමිතිවල හතු පිපෙන්නා වගේ පිපෙනවා. හෙට පරවෙලා යනවා. මෙහෙම අවස්ථාවක විශේෂයෙන් ඇහැලියගොඩ ගත්තහම ගරු සභාපතිතුමනි භාරකෝටි අනූහතර ලක්ෂයක් පාඩු වින්ද විවිධ සේවා සමූපකාර සමිතියක් මම මේකේ තොරතුරු සියල්ලම අපේ ගරු විෂයභාර ප්‍රධාන ඇමතිතුමාට කියලා තියෙද්දී එතුමාගේ මූලිකත්වයෙන් එතුමාගේ දායකත්වයෙන් සභාව දැන් අද ගත්තහම ගරු සභාපතිතුමනි ඉතාම සීඝ්‍රයෙන් දියුණු වෙච්චි සභාවක් බවට පත් වෙලා තියෙනවා. මේක උදාහරණයක් මම කිව්වේ ඇහැලියගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය ගරු සභාපතිතුමනි මෙතන සභාපතිවරයාට රු.40000/- ක දීමනාවක් දෙනවා. උපසභාපතිවරයා ගත්තහම සභාපතිවරයාට වැඩියෙන් වැඩ කරන කෙනෙක් වෙලා තියෙනවා උපසභාපති. අපි මේ උදාහරණයක් කියන්නේ ඇහැලියගොඩ කියලා. ඒ උපසභාපතිවරයාගේ දායකත්වය කැපවීම උඩ අතිවිශාල සංවර්ධනයක් දියුණුවක් තමයි ගරු සභාපතිතුමනි ඒ දායකත්වය උඩ තමයි ගරු සභාපතිතුමනි මේ සමිතිය දියුණු වෙලා තියෙන්නේ. ඉතිං මේ සමූපකාරය දියුණු වෙන කොට ඒ උපසභාපතිවරයාට මෙතෙක් කීයක්වත් දීමනාවක් නොදෙන වෙලාවට , දැන් කීයක්වත් දීමනාවක් ගෙවන්නේ නෑ. මේ සභාපතිවරයාට දෙන රු.40000/- න් දෙකෙන් පංගුවක්වත් උපසභාපතිවරයාට දෙනවා නම් මේ විවිධ සේවා සමූපකාර සමිතියේ තවත් දියුණුවෙන් දියුණුවට පත් වෙනවා. ඒ දියුණු වෙනවා කියන්නේ ඒ පොඩි මිනිහාගේ කඩයක්. ව්‍යාපාරයක්. ඒ පොඩි මිනිහාගේ ව්‍යාපාරය දවසින් දවස දියුණු වෙන කොට ඒකේ ඉන්න සේවක සේවිකාවන්ට වරප්‍රසාද ලැබෙන අතර ඒ තුළින් ගත්තහම ගරු සභාපතිතුමනි ප්‍රදේශයේ ජනතාවට අතිවිශාල සේවාවක් සිදු වෙනවා. එහෙම නම් මම මේ ගරු සභාවට ගේන්නේ මේ දැනට සත පහක්වත් නොගෙවන විශාල කැප කිරීමක් කරන උපසභාපතිට මේ ගරු සභාපතිවරයාට ගෙවන වැටුපෙන් දීමනාවෙන් දෙකෙන් පංගුවක්වත් උපසභාපතිවරයාට ලබාදීමට කටයුතු කරන්න කියලා මේ යෝජනාව ගේනවා ගරු සභාපතිතුමනි. කාලය ලබාදීම සම්බන්ධව ඔබතුමාට ස්තූතියි.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka*
----------------------------------

බොහොම ස්තූතියි මන්ත්‍රීතුමනි. මීළඟට අපේ මහීපාල හේරත් ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්*
*கௌரவ பிரதான அமைச்சர்*
*Hon.Chief Minister Mahipala Herath*
----------------------------------

ගරු සභාපතිතුමනි මම ස්තුතිවන්ත වෙනවා අපේ සිරිපාල කිරිඇල්ල එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ සංවිධායකතුමාට මේ යෝජනාව මෙතුමා ගේන අවස්ථාව වනවිටත් අපේ සභාපතිවරු සහ

සාමාන්‍යාධිකාරිවරුන් විසින් පවත්වන ලද වැඩ මුළුවකදී පසුගිය සතියේ මෙම දීමනාව ගරු උපසභාපතිවරුන්ට සභාවේ ලැබෙන ලාභයේ ප්‍රතිශතය අනුව ගෙවීමටත් ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ගැනීමටත් තීන්දුවක් අරගෙන ඒ සම්බන්ධයෙන් කොමසාරිස්තුමා වෙත වාර්තාවක් කරලා තිබිලා කොමසාරිස්තුමා මේ වැදගත් යෝජනාව ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු සලසලා තියෙනවා. ඒ නිසා එතුමාගේ යෝජනාව ඉතාම කාලෝචිතයි. ඒක හැබැයි සමිතියේ ලැබෙන ලාභය අනුව තමයි මේ අයට දීමනාවක් දෙන්න පුළුවන් වෙන්නේ. ඒවගේම ඒ දීමනාව මහා සභාව විසින් අනුමත කළාට පසු තමයි ගරු උපසභාපතිවරයාට හෝ ගරු අධ්‍යක්ෂකවරුන්ට ලබා ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා විවිධ සේවා සමූපකාර සමිති මෙම පළාතේ තියෙන 23 එකතු වෙලා සභාපතිවරු සහ සාමාන්‍යාධිකාරීවරුන් විසින් පවත්වන ලද සමුළුවේදී ගන්නා ලද තීන්දුවක් අනුව ඒක මටත් අපේ කොමසාරිස්තුමා උදේ දැන්නුවා. කොමසාරිස්තුමා දැනටමත් ඒ ලිපිය යවලා තියෙනවා. ඔබතුමාගේ යෝජනාව ඉතාමත්ම වැදගත් හා කාලෝචිත එකක් හැටියට අපි දකිනවා. ඒ නිසා ඒ කටයුත්ත සඳහා ඉදිරි කාලවකවානුවලදී අදාල විවිධ සේවා සමූපකාර සමිතිවල අධ්‍යක්ෂක මණ්ඩලවලට සහ මහා සභාවලට ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්නට සමූපකාර දෙපාර්තමේන්තුවේ අවශ්‍ය අනුමැතිය දැනට ලබාදීලා තියෙනවා කියන එක මම බොහොම

සංතෝසයෙන් ඔබතුමා වෙත දන්වනවා. ඒක මං හිතන්නේ මේ සභාවේ කවුරුවත් අනුමත කරන දෙයක්. මේ කාර්යය සඳහා ගරු සභාපතිතුමනි දැනට මේ තීරණය සමූපකාර දෙපාර්තමේන්තුව විසින් අරගෙන තියෙන බව මට දන්වලා තියෙනවා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***

***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*** *Hon.Opposition Whip Siripala Kiriella* ----------------------------------------------------

ගරු සභාපතිතුමනි අපේ ප්‍රධාන ඇමතිතුමා කිව්වේ දැන් සතියකට කලින් මේ යෝජනාව සම්මත කර ගත්තා කියලා. ගරු සභාපතිතුමනි ප්‍රධාන ඇමතිතුමා මාත් එක්ක අමනාප වෙන එකක් නැහැ. මම ගරු ප්‍රධාන ඇමතිතුමාට සභා ලේකම්තුමා හරහා මේ 2016.12.29 තමයි එවලා තියෙන්නේ. ඒ අනුව මගේ යෝජනාව දාලා තියෙන්නේ 2017.04.17. එතකොට සතියකට ඉස්සෙල්ලයි මේ යෝජනාව සම්මත වුණා කියලා ප්‍රධාන ඇමතිතුමා කියන්නේ. ඒ උඩ මම කියන්නේ ප්‍රධාන ඇමතිතුමා තප්පරයක් ඉන්න. මම මේ යෝජනාව සභා ලේකම්තුමා හරහා තමුන්නාන්සේට දීලා තියෙන්නේ 2016.12.20 එතකොට සම්මත වෙන් ඉස්සෙල්ලා මේක දීලා තියෙන්නේ.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***

***கௌரவ பிரதான அமைச்சர்***

*Hon.Chief Minister Mahipala Herath*

**-------------------------------------------**

එක දවසක මට ඒ රැස්වීමට එන්න බැරි වෙච්චි අවස්ථාවක ඒ සභාපතිවරු සහ සාමාන්‍යාධිකාරීවරු සමහර වෙලාවට මෙතුමාත් ඒ අය දැනුවත් කරලා තියෙන්න

ඇති. ඒ ගත්ත යෝජනාවත් මම දන්නේ නෑ ඒක. නමුත් මේක මම කරපු දෙයක් නෙමෙයි. සභාපතිවරු සහ සාමාන්‍යාධිකාරීවරු සියළු දෙනාම දෙපාර්තමේන්තුවත් එක්ක සහ අමාත්‍යාංශ එක්ක තිබ්බච්චි වැඩ මුළුවකදී මට අද උදේ තමයි අපේ කොමසාරිස්තුමා මම මේ සම්බන්ධයෙන් තොරතුරු කතා කරන්න ගත්තහම මට ඇවිල්ලා කිව්වා. ඒක තමයි මම මේ සභාවට ඇවිල්ලා දන්වන්නේ. ඒක ඇත්තටම ඔබතුමා සතුටු වෙන්න ඕනේ ඒ

මට්ටමට සමිතිවල ඉන්න අය දැනුවත්වීමක් හෝ නොදැනුවත්වීමක් හෝ හැබැයි ඒ උපසභාපතිවරයාගේ ඒ තියෙන අයිතිය වරප්‍රසාදය ලබා දෙන්නට ඔබතුමා ගත්තා වූ තීන්දුව පොදු තීන්දුවක් හැටියට ඉතා වටිනවා. ඉතිං ඒකට ඔබතුමා සතුටු වෙන්නට ඕනේ. මාත් සතුටු වෙනවා සමූපකාර ඇමතිවරයා හැටියට. අපිට තව අවශ්‍ය නම් ඔබතුමාගේ ලිපිය ඒකත් ඕනේ නම් දන්වලා යවන්න තිබුණා ඔබතුමාත් ඉල්ලලා තියෙනවා කියලා . ඉතිං ඊට වඩා දෙයක් කරන්න බෑ.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*

*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல Hon.Opposition Whip Siripala Kiriella* --------------
---------------------------------------

දැන් ඔබතුමා කිව්වේ මේ සතියකට කලින් මේ යෝජනාව සම්මත වුණා කියලානේ. එතකොට තමුන්නාන්සේට මේ කාරණය පෞද්ගලිකවත් මම දවසක් දෙකක් කියලා තියෙනවා. මම මේ යෝජනාව දාලා තියෙන්නේ 2016.12.20. සතියකට ඉස්සෙල්ලා මේ යෝජනාව ගෙනල්ලා සම්මත වුණා කියලා කිව්වහම මට මේක හැල්ලුවට ලක් කිරීමක් ගරු ප්‍රධාන ඇමතිතුමා. තමුන්නාන්සේට මේ අරියාදුවට කතා කරනවා නෙමෙයි මම. මේ පිටපත මාගාව තියෙනවා. ඔබතුමාට දැන ගන්න මම ඒක දෙන්නම්.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්*

*கௌரவ பிரதான அமைச்சர்*

*Hon.Chief Minister Mahipala Herath*

-------------------------------------------

ගරු සභාපතිතුමනි මේ සමුළුව සාකච්ඡා වැඩ මුළුව තිබුණ එකක්. මම මේ ගොතලා හදන කතාවක් නෙමෙයි. ඔබතුමාට බලාපොරොත්තු වෙන්න පුළුවන් ඒක අම්පාරෙදී සියළු දෙනා එකතු වෙලා තියලා තියෙන්නේ. මේක ඇත්තටම ඔබතුමා මේ කාරණාව මේ සභාවට දාලා අවශ්‍ය නම් සභා තීන්දුවක් ගන්න. ඒක ගැටළුවක් නෑ. මම පවතින තත්ත්වය තමයි ගරු සභාපතිතුමනි කිව්වේ. ඒක දැන්වීම මගේ වගකීමක් නැත්නම් නිහඬව ඉන්න පුළුවන් තමුන්නාන්සේලා ඔක්කෝම කතා කරලා වාද කරලා යනකන්. නමුත් මම දැන්වූවේ මේ වෙලා තියෙන එක මට අපේ කොමසාරිස්තුමා දැන්වූවාම මගේ යුතුකමක් සහ වගකීමක් වෙනවා ගරු සභාපතිතුමනි ගරු සභාවට සහ ගරු ඔබතුමාට දන්වන්න.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*

*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka* -------------------------------
---------------------------------------------------------------

බොහෙම ස්තූතියි ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. මේ කාරණාව සම්බන්ධව ඔබතුමා සහ අමාත්‍යාංශ ලේකම්වරුන් සහ අදාල නිළධාරීන් ඒ සම්බන්ධව අවධානය යොමු කරලා ඒවගේම ඒ සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරලා ඒවගේම ඒ ලාභ ලබන සමූපකාර සමිතිවල ඒ අදාල උපසභාපතිවරුන්ට ගෙවන්න ඒ අනුමැතිය ලබාදීම සම්බන්ධව. ඒවගේම ඒ තීන්දු තීරණ ගැනීම සම්බන්ධව සතුටු වෙනවා. අපේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීවරයාට ඕනකම තියෙනවා එතුමා නිසා මේක වුණා කියලා

කියන්නයි. එහෙම නේද අවශ්‍යතාවය තියෙන්නේ. ඒක නිසා එතුමා ඒක භාර ගන්න . එතකොට ප්‍රශ්නයක් නැනේ.

ඊළඟට 15.2 විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ දෙවෙනි යෝජනාව.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல Hon.Opposition Whip Siripala Kiriella* ----------------------------------------------------

ගරු සභාපතිතුමනි මේ යෝජනාව එක්කෝ අමාත්‍ය මණ්ඩලය කවුරු හෝ ආපුවහම ගනිමු. මේක ඉතා වැදගත් කෘෂිකර්ම ඇමතිතුමා හිටියා නම් ,එහෙම නැත්නම් මේක ඊගාව දිනයට මේක ඇතුළත් කරන්න කෘෂිකර්ම ඇමතිතුමාත් නෑ. අනිකුත් ඇමතිතුමන්ලාත් නැති නිසා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka* ------------------------------------------------------------------------------------------------

එහෙම නම් ඊළඟ දිනයට ඇතුළත් කරන්න පළවෙනි යෝජනාව හැටියට ඇතුළත් කරන්න යෝජනා කරනවා.

ඊළඟට අංක 16 සභාව කල් තැබීමේ යෝජනාව ගේන්න ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා.

**සභාව කල් තැබීම :**

*ගරු සභානායක අසෝක ජයවර්ධන*
*கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
*Hon.Gov.Whip Asoka Jayawardane*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි මෙම ගරු සභාව 2017 ජූලි මස 11 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබන්න මම යෝජනා කරනවා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka* ------------------------------------------------------------------------------------------------

බොහොම ස්තුතියි ගරු සභානායකතුමා.

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා:**

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka* ------------------------------------------------------------------------------------------------

මේ යටතේ ආරියවංශ මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී බී.ආරියවංශ கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ Hon.Member B.Ariyawansha* --------------------------------------------

ගරු සභාපතිතුමනි සභාව කල් තබන අවස්ථාවේදී මගේ යෝජනාව ඉදිරිපත් කරනවා. ඇඹිලිපිටිය කොළඹගේආර

පනහඩුව මාර්ගය මේ වෙන කොට ඉතාම අබලන් තත්ත්වයේ තියෙන්නේ. මේ මාර්ගයේ පසුගිය වර්ෂයේත් කිලෝමීටර් දෙකක් පමණ අපේ මාර්ග ඇමතිතුමාගේ අමාත්‍යාංශය මගින් සංවර්ධනය වුණා. තව කිලෝමීටර් 4.6 ක් තියෙනවා මේ මාර්ගය සංවර්ධනය කර ගන්න අවශ්‍යයි. ඒ නිසා ඒ ප්‍රදේශයේ ගාමිණී වැඩිහිටි නිවාසය තියෙන ප්‍රදේශයට මම ගියා. ඒ අවස්ථාවේදී ඒ වැඩිහිටි නිවාසයට දුරබැහැරින් විශාල පිරිසක් දානය රැගෙන එනවා. ඒ රැගෙන එන අය සඳහන් කරනවා මොකද ඒ අයට හැමදාම එන කොට මේ මාර්ගයේ අපහසුතාවය මත ඒ වැඩිහිටි නිවාසයට දානය පවා අහිමි වෙන තත්ත්වයට පත් වෙලා තියෙනවා. ඒවගේම තමයි පාසැලත් ඒවගේම බස් රථ ගමන් කරන මාර්ගයත් එම නිසා මේ වසරේ කෙසේ හෝ ඒ මාර්ගය සංවර්ධනය කරලා දෙන්න කියලා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ඒවගේම ගරු සභාපතිතුමනි මම මීට සැසි තුනකට කලින් යෝජනාවක් ඉදිරිපත් කළා කොලොන්නේ රෝහල පිළිබඳව. එම නිසා ඒ රෝහල අද පත් වෙමින් තියෙන තත්ත්වය පිළිබඳව මම එදා විග්‍රහ කළා. ඒ අවස්ථාවේදී මේ පිළිබඳව මෙතෙක් කිසිම සොයා බැලීමක් සිදු වෙලා නෑ. දැනට මාස දෙකක් පමණ වෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***

*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka* ------------------------------ ----------------------------------------------------------------

බොහොම ස්තූතියි ආරියවංශ බාසූරිය මන්ත්‍රීතුමාට. ඒ කාරණා ඉදිරිපත් කිරීම සම්බන්ධව. එතුමාගේ යෝජනා දෙකම සම්බන්ධව ඒවගේම ඒ අදාල මාර්ග අමාත්‍යවරයා ඒවගේම ඒ ලේකම්වරයාට වහාම දැනුම්දීලා ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන්නත්. ඒවගේම ප්‍රධාන අමාත්‍යවරයා සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට අදාල යෝජනාව ඉදිරිපත් කරලා ඒ මාස කීපයක් පහුවුණ යෝජනාව සම්බන්ධව එතුමාට ඒ දැනුවත් කිරීමත් ඒ සාධාරණයක් ඉෂ්ඨ කිරීමක් කරන්න කියලාත් මම මේ සභාවට යෝජනා කරනවා.

මීළඟට සිරිපාල කිරිඇල්ල මැතිතුමාට අවස්ථාව.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***

*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல Hon.Opposition Whip Siripala Kiriella* -------------- ----------------------------------------

ගරු සභාපතිතුමනි අපේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාට මේ යෝජනාව දෙන්නේ. ගරු ඇමතිතුමා පරකඩුව කණිෂ්ඨ විද්‍යාලයේ මේ ඊයේ පෙරේදා ගියා ගිලා බහිනවා කියලා. බලාපුවම ගියා බහින්නේ පේව්මන්ට් එක. පේව්මන්ට් එක තුන් හතර පොළකින් ගිලා බහිනවා. ඒවායේ ෆොටෝ තියෙනවා. මෙතන 1-5 ළමයි තමයි ඉගෙන ගන්නේ. ළමයි හාරසිය අනූ ගාණක් ඉන්නවා. කරුණාකරලා

මේ ළමයි ගැන විශේෂ අවධානය යොමු කරලා ඔබතුමා මෙන්න මේක හදලා දෙන්න ඒතරම් ලොකු මුදලක් යන්නේ නෑ. ඔබතුමා ක්ෂණිකව හැදුවොත් ළමයි දාන්න බෑ ඒ හෝල් එකට.

ඒවගේම ගරු සභාපතිතුමනි අපේ රංජිත් බණ්ඩාර ගරු ඇමතිතුමාට මේක දෙවෙනි ප්‍රශ්නය. ගරු ඇමතිතුමා මඩල යටිපච්ච ඔබතුමාලා දැනගන්න ඇති රූපවාහිනියෙන් ගුවන්විදුලියෙනුත්, පුවත්පත් වලිනුත් මං හිතන්නේ යට වෙලා තුන් හතර වේලක් කන්න නැතුව මිනිස්සු ඉන්න ඇති මේ ප්‍රදේශයේ ගරු සභාපතිතුමනි. මේ ප්‍රදේශවලට දුන්නු ඔරු වලින් කිසිම ප්‍රතිලාභයක් ජනතාවට සිද්ධ වුණේ නෑ ගරු සභාපතිතුමනි. මම පෙර කියාපු ආකාරයට මේවායේ විනෝද සවාරි තමයි ගරු සභාපතිතුමනි පෙලක් පෙලක් උදවිය කාලා බිලා ගියේ. දැන් අපි ඉල්ලන්නේ මෙතන කලුවාවලතැන්න පාර ඇල්ලගාව ලිපිනයේ පදිංචි කේ.කේ.එස්.අත්තනායක මහත්තයාගේ එකක් අනිත් එක මඩල යටිපච්ච කරඳන ලිපිනයේ පදිංචි ලලිත් මහත්තයාගේ මේ යෝජනා දෙක ගරු සභාපතිතුමනි මේ ඔරු අඟුල් දෙකක් ඉල්ලන්නේ දෙපැත්තට මේක ගරු සභාපතිතුමා ප්‍රාදේශීය ලේකම් භාරයට දෙන්න කියන්න. ප්‍රාදේශීය ලේකම්ට දුන්නහම අදාල ග්‍රාම නිළධාරී හරහා ඒ ඔරුව මේන්ටේන් කරන්න පුළුවන්. මොකද ඔරු අරගෙන විවිධාකාරයේ අකටයුතු සිදු වෙන අතර ජනතාවට එයින් සේවයක් නොවෙනවා.

ඒ නිසා ප්‍රාදේශීය ලේකම්ට භාරදීලා ප්‍රාදේශීය ලේකම් හරහා තමයි අදාල වසමේ ග්‍රාම නිළධාරී හරහා මේ ජනතාවට මේ සේවය ලබා දෙන්නට කියන්නේ ගරු සභාපතිතුමනි. මෙන්න මේ ඔරු අඟුල් දෙකක් ඉල්ලලා තියෙනවා මම මේ ලිපි දෙකම සභාගත කරනවා. රංජිත් බණ්ඩාර ගරු ඇමතිතුමාටයි මේ යෝජනා දෙක තියෙන්නේ.

ඉතුරු එක ගරු සභාපතිතුමා අපේ සෞඛ්‍ය ඇමතිතුමාට

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර*

*கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara* -------

-----------------------------------------------

ගරු සභාපතිතුමනි පහුගිය සභාවේ කතා කරලා මේ සම්බන්ධව අපිට සභාලේකම්තුමිය එවලා තියෙනවා. ගරු සභාපතිතුමා අපි ඔරු අඟුල් ලබාදීමේ කටයුත්ත කළේ පසුගිය කාලයේදී ග්‍රාම නිළධාරීන්ගේ නිර්දේශයට යටත්ව. නමුත් සමහරක් තැන්වල පහුගිය ගංවතුරේදී අපි දැක්කා මමත් අත්වින්දා ඒ ප්‍රශ්නය . මොකක්ද ඔරුව දුන්නහම ඔරුව අපිට අත වන වනා යනවා. අපිව ගෙනියන්නේ නෑ එගොඩ මෙගොඩ. තමාගේ පුද්ගලික දෙයක් හැටියට තමයි මේ ඔරු අඟුල් මේ අය පාවිච්චි කරන්නේ. ඒ නිසා සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අපි අද පාවිච්චි කරනවා. අපි අද පිළිගන්නවා ඒක. ග්‍රාම නිළධාරී හරහා ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඔරු අඟුල් භාර දීලා ඒ අයගේ සේවාව ලබාගන්නට තීන්දු කළා අපි අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු අපි සියළු දෙනාම. ඒ නිසා එතුමාගේ යෝජනාව පිළිඅරගෙන ඉදිරියේදී ඔරු අඟුල් ලබාදීමේ වැඩ පිළිවෙල ඒ ආකාරයෙන්ම ලබාදීමට කටයුතු කරනවා

ඒවගේම 100% ම මේ අවභාවිතාව සිද්ධ වුණේ නෑ. සමහරක් තැන්වල. අපි දැක්කා සමහරක් අපි ඔරු දීපු ඉතා මැනවින් ඒ අය කටයුතු කළා. ඒ අය ජනතාව එගොඩ මෙගොට ගෙනියන්නට ජනතාවගේ අවශ්‍යතාවයන් අනුව ජනතාව බේරා ගැනීමට. ඒවගේ අත්දැකීම් අපිට තිබෙනවා ජනතාවට

ඉතාමත් සේවාවක් කළා මේ ඔරු අඟුල්. නමුත් සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා මතු කරපු ස්ථානවල අපි සොයා බලනවා නමුත් ඒවගේ තැන්වල ඒ අක්‍රමිකතා සිද්ධ වෙලා තියෙනවා

නම් ඒ ඔරු අභුල් අපි නැවත ග්‍රාම නිළධාරී හරහා ප්‍රාදේශීය ලේකම් භාරයට ලබාගන්න කටයුතු කරනවා කියන එකත් මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනේ. බොහොම ස්තූතියි.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ---------------------------------------------------------------------------------------------

බොහොම ස්තූතියි ගරු සමාජ සේවා අමාත්‍යතුමාට.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல* *Hon.Opposition Whip Siripala Kiriella* ---------------------------------------------------

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අපේ ප්‍රධාන අමාත්‍යතුමාට තියෙන්නේ ගරු සභාපතිතුමනි. අපේ රංවල ප්‍රාදේශීය රෝහලේ පවතින අඩුපාඩු පිළිබඳව පළමුවෙන්ම මේ සම්බන්ධව ගිය අවුරුද්දේ ප්‍රධාන ඇමතිතුමාට කියලා මේකේ කොරිඩෝවක් ලබාදීම සම්බන්ධව ගරු සභාපතිතුමනි තුන්ලක්ෂ ගාණකට එතුමාට මම මේ සභාවේ ගෞරවනීය ස්තූතිය පිරිනමනවා.

මේකේ තියෙනවා විශාල අඩුපාඩු ටිකක් ගරු සභාපතිතුමනි. වෛද්‍ය නිළධාරී දෙන්නයි. දන්ත ශල්‍යාගාර වෛද්‍ය නිළධාරී එකයි. හෙද නිළධාරී එකයි. කළමණාකරන සහකාර නිළධාරී එකයි. ජලනල කාර්මික එකයි. භෞතික සමිති වෛද්‍ය නිළධාරී දෙකයි. සහකාර වෛද්‍ය නිළධාරී එකයි. උපස්ථායක එකයි. රෝහල් භූමිය තුළ මාර්ග පද්ධතිය කොන්ක්‍රීට් කිරීම මේවගේ කාරණා කීපයක් තියෙනවා ගරු සභාපතිතුමනි.

මේක ග්‍රාමීය රෝහලක් මේ ප්‍රදේශය ගත්තහම. අතිවිශාල කම්කරුවෝ කිරි කපන,තේ දළු කඩන ,කුළී වැඩ කරන උදවිය බහුතරයක් 90% විතර ඉන්නේ ගරු සභාපතිතුමනි. සමෘධිලාභීන් මේ අයට රෝහලක් කියලා රත්නපුරයට එන්න තරම් වත් පොහොසත්කමක් නෑ. මේ රෝහලේ තියෙන අඩුපාඩුකම් ටික සකස් කරනවාට ගරු සභාපතිතුමනි කිසිසේත් මේ අහිංසක ජනතාව රත්නපුරයට එන්න වුවමනාවක් නෑ.

මෙන්න මේ අඩුපාඩුකම් ටික රංවල රෝහලේ සකස් කරලා දෙන්න කියලා ප්‍රධාන ඇමතිතුමාට සභාව මගින් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ---------------------------------------------------------------------------------------------

බොහොම ස්තූතියි ගරු විපක්ෂ සංවිධායකතුමා. ඒ යෝජනාව අපි ප්‍රධාන ඇමතිතුමාට කටයුතු කිරීම සඳහා අවධානය යොමු කරනවා.

දැන් වේලාව 11.40 යි. මෙම සභාව 2017 ජූලි මස 11 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.

අත්/කළේ :

උදයකාන්තගුණතිලක
නියෝජ්‍ය සභාපති,
සබරගමුව පළාත් සභාව.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017 ක් වූ ජූලි මස 05 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.

(අශෝධිත පිටපත)